සමගි ජන බලවේගය
ஐக்கிய மக்கள் சக்தி
Samagi Jana Balawegaya



# වෛද්‍ය රුවයිස් හනීෆා

## කොළඹ නගරාධිපති අපේක්ෂක

සතුටින් පිරි කොළඹ
පුරවරය සඳහා වූ
ප්‍රතිපත්ති ප්‍රකාශය

drruvaizhaniffa.lk



# ඔබේ නගරාධිපතිවරයා ගැන දැන ගන්න.

## වෛද්‍ය රුවේයිස් හනීෆා
## යුග මෙහෙවරක සේවයක් - කොළඹ නගරයට දැක්මක්

කොළඹ නගරයේ උපන් මා, හැදී වැඩුණේ ද මේ නගර සීමාවේමය. මට අධ්‍යාපනය ලබා දී, පුහුණුව සලසා දී, මේ රටට මා විශිෂ්ටයකු කළේ මේ කොළඹයි.

මා උපන් දේශය, ශ්‍රී ලංකාව තුළම රැඳෙමින්, මගේ මුළු දිවිය පුරාම ඇයට සේවය කිරීම මගේ අරමුණයි. අද මේ තත්වය  මා ගෙන ආ මගේ සදාදරණීය නගරයට සේවය කිරීම සඳහා මා දැන් මෙලෙස ඉදිරි පියවර තබන්නෙමි.

මගේ සීයා වන, අභාවප්‍රාප්ත එම්. එච්. මොහොමඩ් මහතා, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ධූරය හෙබවීමට පෙර, වරක් කොළඹ පුරපතිවරයා ලෙසද කටයුතු කළා. මට, එතුමාගේ උරුමය හුදෙක් දේශපාලනික වැදගත්කමකට වඩා අතිශය ගැඹුරු පුද්ගලික ඉගැන්වීම් සමුදායක් බව කිව යුතුව තිබේ.

ඔහු මට පෙන්වා දුන්නේ, මහජන සේවය යනු බලය හා බැඳි කිසිවක් නොව, පරමාදර්ශය හා බැඳුණු සේවාවක් බවයි. එය, ඔබ කෙරෙහි විශ්වාසය තබන ජනතාව වෙනුවෙන්, සෑම දිනකම, ක්‍රියාවෙන් කරන කැපවීමක් බවත් එය උතුම් අරමුණක් බවත් ඔහු මට කියා දුන්නා.

මගේ ජීවිත කාලය පුරාවට මා මෙහෙයවා ඇත්තේ එම විශ්වාසයයි.

මා වෛද්‍යවරයකු ලෙස, රටේ යුද ගැටුම් උත්සන්න සමයේ යාපනයේ සිටිමින් යුද පෙරමුණෙහි අපගේ හමුදා භට පිරිස් සමඟ උරෙනුර ගැටී යුද බිමේ තුවාල ලබන අපේම මිනිසුන්ට ප්‍රතිකාර ලබා දී තිබේ.

මා යුද හමුදා රෝහලේ ද, රජයේ රෝහල්වල ද, ප්‍රජා මට්ටමේ සායනවල ද ප්‍රතිකාර සේවා ඉටුකර ඇත්තෙමි. අනාගත වෛද්‍යවරුන් සිය ගණනක් පුහුණු කළෙමි. එමෙන්ම, ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ව්‍යායාමය තුළ මම මගේ ප්‍රමුඛ දායකත්වය ලබා දුන්නෙමි. මා ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ සභාපතිවරයා ලෙස ද සේවය කර ඇති අතර දිවයින පුරා ප්‍රාථමික රෝගී සත්කාරක කටයුතු, වේදනා නාශක ප්‍රතිකාර කටයුතු සහ වැඩිහිටි සත්කාර සේවා කටයුතු ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ කාර්යයට ද මගේ නොමඳ සහය ලබා දුනිමි.

ඒ සෑම වැඩකදීම වුව ද, මම මගේ රාජකාරිය කිසි දිනක අත්හැර නොගියෙමි. මම, 100% ක් ම පරිපූර්ණ ශ්‍රී ලාංකීය නිර්මාණයක් වන්නෙමි. මාගේ දේශයේ ජනතාවගෙන්, ඔවුන්ගේ ජීවිත අරගලයෙන් හා දැඩිව ඔරොත්තු දීමේ ශක්තියෙන් මම ද පන්නරය ලද අයෙක් වන්නෙමි.

සියලු ආගමික කොටස් සාදරයෙන් පිළිගන්නා අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් වන, ඩී. එස්. සේනානායක විද්‍යාලයෙන් සිප් සතර හැදෑරූ සමයේ, විද්‍යාව, ඉතිහාසය ආදී විෂයන් ඉගෙනුමට එහා ගොස් සියලු ජන මූලයන් සහිත වූවන් සමඟ ජීවත්වන ආකාරය ද උගත්තෙමි. මෙත්තා, කරුණා, මුදිතා ගුණය, සර්ව සාධාරණත්වය හා ජන කොටස් සමඟ ගැඹුරු බැඳීම සහිතව ලොව දකින ආකාරය පිළිබඳව දැනකියා ගත්තෙමි.

දැන්, මා විශ්වාස කරන්නේ, ඒ පරිද්දෙන්ම වූ විනය, කරුණා ගුණය සහ අවධානය කොළඹ මහ නගර සභා පරිශ්‍රය වෙත ද ගෙන ඒමට කාලය එළඹී ඇති බවයි. මක්නිසාදයත්, කොළඹ නගරය, දුක් විඳිමින් සිටියි. ඒ තුළ ජනතා හඬ යටපත්ව තිබේ.  ඇස නොගැටුණු ජන කණ්ඩායම් අරමුණු සහගත බලාපොරොත්තුවක පසුවේ.

සැබවින්ම අපට මෙම තත්ත්වයට සාර්ථකව පිළියම් සෙවීමට පුළුවන්. එය අත්කර ගත හැක්කේ, සටන් පාඨවලින් හෝ ඝෝෂා කිරීමෙන් නොව, ඊට සුදුසු විසඳුම් සහ ඉලක්කගත සැලසුම් යෙදීමෙන් බව මා පසක් කරගෙන තිබේ.


පිවිතුරු පාලනය සහ සෑම තීරණයක්ම ප්‍රජා කේන්ද්‍රීය ලෙස ගැනීම තුළින් ගැටුම් නැති, ප්‍රතිඵල ඇති පාලනයක් බිහිකළ හැකි බව මාගේ අදහසයි.

මෙය හුදෙක් ඡන්ද ව්‍යාපාරය ආශ්‍රිත කර්තව්‍යයක් නොව මෙය කාලීන සැලසුමක් සහිත කැඳවුමක් බව කිව යුතුය. මෙය මා ජීවය ලද, පෝෂණය ලද බිමට කරන බුහුමන් දැක්වීමක් බඳුය.

එසේනම් මේ අප සැමගේ ආඩම්බරයට පාත්‍ර වන කොළඹ අග නගරය, නූතනවාදී පුරවරයක් ලෙස ගොඩනැගීම සඳහාවූ එළඹුමයි.

**අප සැම එක්ව සතුටු කොළඹ බිහි කරමු.**

සතුටින් පිරි කොළඹ පුරවරයකට





# පටුන


මුල් අවධියේ සිට එක හා සමානව ඉගෙන ගැනීම ---------------------- 6

සුපැහැදිලි වීදි ජාලය සහ පවිත්‍ර පද්ධති ---------------------- 8

සැමට ප්‍රවේශය සලසා ගැනීමට පහසු කොළඹ නගරයක්. ---------------------- 10

සමීපස්ථ මහ මාර්ග හා සවිමත් සබඳතා ---------------------- 12

නිවැරදිව රථ ගාල් කිරීම හා නිදහස් ලෙස ගමන් බිමන් යාම ---------------------- 14

අද වියළි බව, හෙට ආරක්ෂිත බව ---------------------- 16

අනාගතය ගොඩනගන රැකියා ---------------------- 18

සුහුරු නගරයක්, පවිත්‍ර පද්ධතියක් ---------------------- 20

සෞඛ්‍ය සම්පන්න කොළඹක් - සවිමත් ජීවිතයක් ---------------------- 22

නගරයේ වෙසෙන කාන්තාවගේ අයිතිය ---------------------- 24

පහසු වටපිටාවක දිවි ගෙවන්න, අභිමානයෙන් දිදුලන්න ---------------------- 26

ආරක්ෂිත පියෙසි හා සවිමත් මූලාංකුර ---------------------- 28

දිදුලන නගරයක - අභිමානය සමඟ ---------------------- 30

කොළඹ නගරයේ ව්‍යවසාය සවිබල ගැන්වුම ---------------------- 32

ක්‍රියාකාරී සැලැස්ම ---------------------- 35

කාර්ය සාධන බලකායේ ආකෘතිය ---------------------- 39

# මුල් අවධියේ සිට එක හා සමානව ඉගෙන ගැනීම

## කුමන ස්ථානයක ජීවත් වුවත්, සෑම දරුවකුට ම ශක්තිමත් ජීවිත ආරම්භයක් හිමිවිය යුතු ය.

කොළඹ නගරයේ ජීවත් වන බොහෝ දරුවන්ට ඔවුන් ජීවත් වන ප්‍රදේශය හේතුකොට ගෙනම අවස්ථා නොලැබීම දැකගත හැක. ඔවුන්ගේ ළමාවිය ආරම්භයට අයත් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශය සහ පාසලෙන් පසු ලැබෙන අනුබලය අඩු ආදායම් ලාභීන් ජීවත්වන ප්‍රදේශ ආශ්‍රිත දරුවන්ට සීමා සහිතවීම පෙනී යයි. එය දීර්ඝ කාලීන ලෙස සාමාජීය ලෙස අවාසිදායක තත්වයන් නිර්මාණය කරයි.

දරුවාගේ පසුබිම සැලකීමකින් තොරව, 'මුල් අවධියේ සිට එක හා සමාන ඉගෙනුම් අවස්ථා' යන නගරික අධ්‍යාපන ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, සෑම දරුවෙකුට ම ගුණාත්මක ඉගෙනුම් අවස්ථා සඳහා ප්‍රජාපාදක සහයෝගය ලබාගැනීමයි.

අධ්‍යාපනය සඳහා අවශ්‍ය මෙවලම් ලබා ගැනීමට ප්‍රවේශය සලසා දීම මේ ඔස්සේ සිදුවන අතර මෙම ව්‍යායාමය මගින්, සෑම දරුවෙකුට ම සාධාරණ ජීවිත ඇරඹුමක් හිමිකරදීම අරමුණ වේ. අධ්‍යාපන සංවර්ධනය හෙට දවසේ ශක්තිමත් කොළඹ නගරයක් ගොඩනැගීමටත් රුකුලක් වනු ඇත.

**දැනට අප සතු දෑ කවරේ ද?**

- ප්‍රධාන නගරය ආශ්‍රිත ප්‍රදේශවල පිහිටි රජයේ පෙර පාසල් ගණන සුළු සංඛ්‍යාවක් වන අතර, මෙම පාසල් බොහෝ විට ළමුන්ගෙන් පිරී පවතී. ඒවා අඩු ආදායම් ජනාවාස පෙදෙස්වලින් බෙහෙවින් දුරස්තව පිහිටා තිබේ.
- මහල් නිවාසවල, ඌණ සේවා සැලසි නාගරික කොට්ඨාසවල හෝ අවිධිමත් ජනාවාසවල වෙසෙන ළමුන් සඳහා ව්‍යුහාත්මක ඉගෙනුම් අනුබලයක් නොමැත.
- සීමිත රාජ්‍ය නොවන සංවිධාන කීපයක් ක්‍රියාත්මක වෙමින් ඔවුන්ගේ අනුග්‍රහය දක්වන නමුත්, ඒවායේ තිර පැවැත්ම පැහැදිලි නැත. ඒවා මහ නගරය පුරා ව්‍යාප්තව නොමැත.
- අත්හැරී පසුපසට යන ළමුන් සඳහා පාසැල් වේලාවෙන් පසු ක්‍රියාත්මක වන විධිමත් ඉගැන්වීම් වැඩසටහන් කිසිවක් නොමැත.

**අප හඳුන්වා දෙන නව අංග මොනවාද?**

1. ජංගම පෙර පාසැල්: රෝද මත දිවෙන පෙර පාසැල්
- ඌණ සේවා සහිත ප්‍රදේශවල ප්‍රජාවගේ දරුවන් වෙත ආරක්ෂිත, විනෝදජනක හා ප්‍රවේශ විය හැකි ජංගම පන්ති කාමර සංකල්පය ඔස්සේ සෘජුවම මුල් ළමාවිය සංවර්ධනයට අවශ්‍ය ඉගෙනුම් ක්‍රියාකාරකම් සමීප කිරීම.
- වයස අවුරුදු 5 ට අඩු ළමුන් සඳහා ආරක්ෂිත හා ක්‍රියාකාරී ඉගෙනුම් අවකාශයක් ඇති කිරීම.

2. ප්‍රජා ඉගෙනුම් කේන්ද්‍ර
- මහල් නිවාස, පන්සල්, මුස්ලිම් පල්ලි සහ ප්‍රජා ශාලා යනාදියෙහි පාසැල් වේලාවෙන් පසු ඉගෙනුම් උපකාරක කලාප ඇති කිරීම.
- කියවීම, කතන්දර කීම, මූලික ඉගැන්වීම් සහ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා අවස්ථාව සලසා දීම.

3. නගරයේ ළමුන් සඳහා 'සිටි කිඩ්ස් පාස්' බලපත්.
- ත්‍යාග පදනම් වූ ඉගෙනුම සඳහා පැමිණීමේ කාඩ්පතක් ලබාදීම.
- පොත්පත්, ක්ෂේත්‍ර චාරිකා සහ නිර්මාණාත්මක ඉගෙනුම් කට්ටල සඳහා ලකුණු මුදවා ගැනීමේ හැකියාව.

4. ළමා ආරක්ෂණ සේවක පුහුණුව
- සෑම ප්‍රජා සමූහයකටම අයත් කාන්තාවන් සඳහා කෙටිකාලීන පුහුණුව ලබා දීම.
- එය සිය අසල්වැසි ගෘහාශ්‍රිතව වෙසෙන ළමුන්ට උපකාර වනු ඇති අතර ඔවුන්ගේ මුල් ළමාවිය රැකබලා ගැනීම හා එය ඔවුන්ගේ ජීවන මාර්ගය බවට පත්කර ගැනීම අරමුණු කර රැකියා අවස්ථා ඇති කිරීම.



# සුපැහැදිලි වීදි ජාලය සහ පවිත්‍ර පද්ධති

## කොළඹ නගරයේ අපද්‍රව්‍ය කළමනාකරණය යන මාතෘකාව නව ප්‍රවේශයකින් සිතන්නට පෙළඹවීමක් ඇති කර තිබේ.

තැන තැන තැබූ කසල බඳුන් සහ නීති විරෝධී ලෙස කසල බැහැර කිරීම්වල සිට කසල එකතු කිරීම හා ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ නව ප්‍රවේශයක් හඳුන්වාදීමට අප කටයුතු කරන්නෙමු. මහජන වගවීම නොමැතිකම හරහා වැඩි වර්ධනය වන කොළඹ නගරයේ කැළි කසල අර්බුදය එහි පදිංචිකරුවන් විෂයයෙහි දෛනිකව ඇති කරනුයේ දැඩි කලකිරීමකි.

වීදි අතර ජාලය සම්බන්ධීකරණය සහිත  පවිත්‍රතා වැඩපිළිවෙලක් සකස් කිරීමත් නීත්‍යානුකූල නොවන කසල බැහැර කිරීම් නිරීක්ෂණයට සහ කඩිනම් ප්‍රතිචාර දැක්වීම වෙනුවෙන් ඒකකයක් පිහිටුවීම. මෙම මුලපිරීම මගින් මහජන සෞඛ්‍ය, පාරිසරික ආරක්ෂාව සහ ප්‍රජා අභිමානය පිරිසිදු නගරයකින් ආරම්භ වන බව සහතික කෙරේ.

**ප්‍රධාන පාර්ශවකරුවෝ**

- කොළඹ මහ නගර සභාව - නගර සීමා තුළ කසල එකතු කිරීම සහ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වගකිව යුතු ප්‍රධාන ආයතනය.
- මධ්‍යම පරිසර අධිකාරිය - පාරිසරික ප්‍රමිතීන් සහ අනුකූලතාවය නියාමනය.
- පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් - කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා සහාය වනු පිණිස කොළඹ මහ නගර සභාව විසින් කුලී පදනම මත සේවය ලබා ගන්නා පිරිස.

**දැනට පවත්නා යටිතල පහසුකම්**

- කසල ට්‍රක් රථ - දෛනික එකතු කිරීම සඳහා භාවිතා වන නමුත් සෑම විටම නිරීක්ෂණයට හසුවී හෝ ප්‍රශස්ත ලෙස යොදා ගනු ලැබ නොමැත.
- ප්‍රවාහනයට පෙර කසල ඒකාබද්ධ කිරීමේ කටයුතු සඳහා වැල්ලවත්තේ පිහිටි ප්‍රධාන නගර හුවමාරු ස්ථානය.
- පුත්තලම අරුවක්කාලු කසල බැහැර කිරීමේ මධ්‍යස්ථානය (කිලෝමීටර් 170 ක් දුරින් පිහිටි)
- පොදු ස්ථානවල නව ඉඩපහසුකම් සහිත බඳුන් ස්ථාපිත කිරීම - නගරය පුරා විසිරී ඇති නමුත් බොහෝ කලාපවල දුර්වල ලෙස නඩත්තු කටයුතු සිදුව ඇත.
- කොම්පෝස්ට් සැකසීමේ සහ ප්‍රතිචක්‍රීකරණය පහසුකම් පුළුල් කිරීම - ඇතැම් කුඩා පරිමාණ මධ්‍යස්ථාන පිහිටා ඇති නමුත් ඒවා ඌණ උපයෝජනයෙන් යුතු ය.
- ජලාපවහන හා කාණු පිරිසිදු කිරීමේ කණ්ඩායම් - සීමිත සම්බන්ධීකරණයක් සහිතව, අපද්‍රව්‍ය කණ්ඩායම්වලින් වෙන්ව වෙනමම ක්‍රියාත්මක වේ.

**දැනට අප සතු දෑ කවරේ ද?**

- කසල එකතු කිරීම සිදුවන නමුත් බොහෝ අඩු ආදායම් ප්‍රදේශ සහ පටු මාර්ග ආශ්‍රිත ප්‍රදේශ මග හැරේ.
- පුත්තලමේ පිහිටි තනි කසල ගොඩකිරීමේ බිමක් කරා කොළඹ අපද්‍රව්‍ය ප්‍රවාහනය කෙරේ – එය, දුර හා මිල අධික වේ.
- පොදු කසල බඳුන් තබා ඇති නමුත් බොහෝ විට ඒවා පිරී ගොස් තිබේ, නැත්නම් කැඩී ගොස් තිබේ.
- කසල එකතු කිරීම සඳහා තත් කාලීන නිරීක්ෂණය කිරීමට හැකි පද්ධතියක් නොමැත.
- කම්කරු සේවකයින් සහ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් පිළිබඳව නිරන්තරයෙන් අධීක්ෂණය නොකෙරේ.
- බොහෝ කැලි කසල වෙන් නොකෙරේ, එමගින් ප්‍රතිචක්‍රීයකරණය සහ කොම්පෝස්ට් සකස් කිරීම දුෂ්කර තත්ත්වයකට පත් කරයි.
- නිසි ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ මහජන දැනුවත්භාවය පහළ මට්ටමක පවතී.

### අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?

- කසළ ට්‍රක් රථ නිරීක්ෂණය කිරීම සඳහාත්, කසල එකතු කිරීමේ ප්‍රමාදයන් විසඳා ගැනීම සඳහාත් GPS තාක්ෂණය භාවිතා කිරීම.
- වඩා නිරන්තර පදනමක් මත පොදු කසල බඳුන් පරීක්ෂා කර අළුත්වැඩියා කිරීම.
- නීති විරෝධී ලෙස කුණු කසළ බැහැර කිරීම නැවැත්වීම සඳහා කැමරා සවි කිරීම සහ නීති බලාත්මක කිරීම සමඟ "පිරිසිදු කලාප" හඳුන්වා දීම.
- “පිරිසිදු කොළඹක් මගෙන් අරඹමු” යනුවෙන් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වන ව්‍යාපාරයක් ආරම්භ කිරීම.
- මාසිකව අපද්‍රව්‍ය බැහැර කිරීමේ කටයුතු අධීක්ෂණය සඳහා නගරාධිපති කාර්යාලය යටතේ පරීක්ෂණ කණ්ඩායමක් පිහිටුවීම.
- කසල ප්‍රතිචක්‍රීයකරණ වැඩබිම් 5 ක් හවුල්කාරිත්ව සහයෝගය යටතේ ඉදිකිරීම.
- සියලු පිරිසිදු කරන සේවක සේවිකාවන් වෙත ආරක්ෂිත ආම්පන්න, පුහුණුව සහ නිරන්තර සෞඛ්‍යාරක්ෂක පරීක්ෂාවන් සලසා දීම.

### අප හඳුන්වා දෙන නව අංග මොනවාද?

- කසල එකතු කිරීම සඳහාත්, අතපසු වූ කසල එකතු කිරීම් සඳහාත්, පිරිසිදු කිරීම් සඳහාත් පැමිණෙන කාලසටහන් දැක්වෙන පොදු ජාලගත යෙදවුමක් හඳුන්වා දීම.
- කසල බඳුන් සම්පූර්ණයෙන් පිරී ගිය විට කසල එකතු කිරීමේ කණ්ඩායම් දැනුවත් කිරීමේ සංවේදක සහිත සුහුරු කසල බඳුන් හඳුන්වා දීම.
- කසල වලින් බිම් ගොඩකිරීම අවම කිරීම සඳහා කසලවලින් බලශක්ති උත්පාදනය කිරීමේ බලාගාරයක් පිහිටුවීම.
- පුරවැසියන් විසින් ඡායාරූප උඩුගත කරනු ලැබීම් සහිතව අවහිර වූකාණු සම්බන්ධයෙන් වාර්තා කිරීමේ පද්ධතියක් පිහිටුවීම.
- හෝටල් හා වෙළඳ සැල් වැනි විශාල කැලි කසල එක්රැස් කරන්නන් නියාමනය කිරීම සඳහා ව්‍යාපාර අපද්‍රව්‍ය බලපත් හඳුන්වා දීම.
- ප්‍රදේශ වශයෙන් කසල ආශ්‍රිත ක්‍රියාකාරිත්වය සහ පිරිසිදුකම ශ්‍රේණිගත කිරීම් පෙන්වන පොදු ලකුණු දීමේ කාඩ්පත් ක්‍රමයක් ඇති කිරීම.
- ගැටලු සහිත ක්ෂේත්‍ර පුරෝකථනය කිරීම සඳහාත්, ප්‍රතිචාරය කඩිනම් කිරීම සඳහාත් කෘතිම බුද්ධිය භාවිතා කිරීම.

### ක්‍රමවේදයේ විනිවිදභාවය හා වගවීම ඇති කිරීම

- මාසික යාවත්කාලීන කිරීම් මහජනයා සමඟ විවෘතව හුවමාරු කර ගැනීම.
- කසළ එකතු කිරීම් නිරීක්ෂණය සහ යෝජනා විසඳුම් නිකුත් කිරීම සඳහා සජීවී විද්‍යුත් උපකරණ පුවරු (ඩෑෂ් බෝර්ඩ්) පිහිටුවීම.
- වඩාත්ම පිරිසිදු කලාප හා කණ්ඩායම් සඳහා කාර්ය සාධනය මත පදනම් වූ ත්‍යාග පිරිනැමීම.
- ප්‍රතිපෝෂණ තොරතුරු සහ ප්‍රගතිය බෙදා ගැනීම සඳහා නිතිපතා ප්‍රජා රැස්වීම් පැවැත්වීම.

# සෑමට ප්‍රවේශය සලසා ගැනීමට පහසු කොළඹ නගරයක්.

## අභිමානනීය, ගෞරවණීය පුරවරයක් පිළිබඳ ප්‍රතිපත්තියක්

සැබවින්ම වැඩිහිටියන් සහ ආබාධ සහිත පුද්ගලයින් ද ඇතුළුව සෑම කෙනෙකුගේම අවශ්‍යතා සපුරාලන නවීන පන්නයේ නගරයක් අප නිර්මාණය කළ යුතුව තිබේ.

සෑම කාර්යයක් සඳහාම ප්‍රවේශය සලසා දීම යනු, පොදු ඉඩ අවකාශ විගණනය කර ඒ හරහා අදාළ යටිතල පහසුකම් නිර්මාණය කිරීමයි. සහායක සේවාවන් පුහුණු කිරීමත්, වැඩි අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා සුරැකුම් පත්‍රයක් හඳුන්වා දීමත්, මෙහි මූලාරම්භයයි.

ඒ අනුව මෙහි ඉලක්කය වන්නේ, කොළඹ නගරයේ සිටින කිසිවෙකු තමන්ගේම වූ නගරයෙන් අත්හැර දමනු ලැබීමයි.

**දැනට අප සතු දෑ කවරේ ද?**

- පොදු ඉඩ අවකාශ හෝ ගොඩනැගිලි ඉතා සුළු ප්‍රමාණයක් රෝද පුටු සඳහා ප්‍රවේශය සහිතය.
- සමහර පෞද්ගලික ගොඩනැගිලිවල බෑවුම් සහිත ප්‍රවේශ ඇති නමුත් බොහෝ පොදු වැසිකිළි, වෙළඳ සැල් සහ උද්‍යාන සතුව ඒවා නොමැත.
- රැකබලා ගන්නන්, ආබාධිත පදිංචිකරුවන් හෝ වැඩිහිටියන් සඳහා නගරය පුරා ව්‍යාප්ත වූ සහායක පද්ධතියක් නොමැත.

**අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?**

- ගොඩනැගිලි, වැසිකිළි, පදික වේදිකා සහ ඇතුල්වීමට අපහසු පොදු ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා විගණනයක් ආරම්භ කිරීම.
- වැඩි වශයෙන් භාවිත කරන නාගරික කොට්ඨාස කාර්යාල, උද්‍යාන, වෙළඳ සැල් සහ බස් නැවතුම් යනාදී ස්ථානවල ප්‍රවේශ වැඩි දියුණු කිරීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.
- රජයේ කාර්ය මණ්ඩල සඳහා මූලික ආබාධිත තත්ත්වයන් සහ සත්කාරක සේවා පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු සැසි පැවැත්වීම.
- ඩිමෙන්ෂියා රෝගයෙන් පෙළෙන අයවළුන්ගේ පවුල්වල අයට සහ එම රෝගීන් රැකබලා ගන්නන් සඳහා සහාය වීම.
    - ඉබාගාතේ ඇවිදින හෝ නැතිවූ පුද්ගලයින් හඳුනා ගැනීමට හා ඔවුනට සහය වීමට උපකාර වන ඔවුන් ආරක්ෂිතව පෙරළා බාරදීමේ හැඳුනුම්පත් ලබා දීමේ වැඩපිළිවෙළක් දියත් කිරීම.

තමන් රාජකාරියේ නිරත කාලය අතරතුර රෝගී වන තම ආදරණීයයන් ආරක්ෂිතව හා අධීක්ෂණයෙන් යුතුව නතර කර තබා යාමට හැකි ප්‍රජා පාදක දිවා පිළිසරණ කණ්ඩායම් තෝරාගත් නාගරික කොට්ඨාසවල පිහිටුවීම.

**අප හඳුන්වා දෙන නව අංග මොනවාද?**

1. නගර ප්‍රවේශකත්ව අරමුදල

- ප්‍රවේශ බෑවුම්, අත්වාරු, වැටි, ප්‍රවේශ පහසුකම් සහිත වැසිකිළි හා සංඥා පුවරු සඳහා මුදල් වෙන් කර ඉහළ ජන ඝනත්වයක් සහිත නාගරික කොට්ඨාස මට්ටමින් එම කටයුතු ආරම්භ කිරීම.

2. කොළඹ නගරාශ්‍රිත සුරැකුම් බලපත්‍ර

- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා නොමිලේ නගරාශ්‍රිත සුරැකුම් බලපතක් ලබාදීම:
- වැන් රථ හා සායන වෙන්කරවා ගැනීම සඳහා ප්‍රමුඛතා ප්‍රවේශය සහ විශේෂ සේවාවන් සඳහා ප්‍රවේශය සලසා දීම.
- රැකබලා ගන්නන්ට ද මේ සඳහා ලියාපදිංචි විය හැකි ය.

3. ඇතුලාන්තීය සංනිවේදන මෙවලම්:

- දැනුවත් කිරීම් නාගරික සීමාවේ දැන්වීම් ලෙස සහ ශ්‍රවණ පහසුකම් සහිතව සරල බසින් බෙදා හුවමාරු කර ගැනීම.
    - සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් ලබා ගත හැකි ක්‍රමවේදයක් හඳුන්වාදීම.



# සමීපස්ථ මහ මාර්ග හා සවිමත් සබඳතා

## කොළඹ නගරය තුළ වඩා ආරක්ෂිත, සුහුරු හා ඇතුලාන්තීය පොදු ගමනාගමනය පිළිබඳ ප්‍රතිපත්තියක්.

දුර බැහැර සිට ජන සමූහයන්, දිගු ගමනකින් පසු කොළඹ නගරයට අවතීර්ණ වන්නේ තමන්ගේ අවශ්‍යතා සහ රාජකාරි පහසුකර ගැනීමේ අටියෙනි.

එහෙත් ගමනා ගමනයට විශ්වාසදායක නොවන මං මාවත් ආදිය කොළඹ නගරය තුළ දස දහස් ගණනක් ජනතාවගේ දෛනික ජීවිතය දුෂ්කරතාවයට පත් කරයි.
“සමීපස්ථ මහ මාර්ග හා සවිමත් සබඳතා” වැඩපිළිවෙළ මගින්, ඌණ සේවා සැලසි ඇති පුරවැසියන්ට සහ දෛනිකව පාසල් වෑන් රථ, මගී බස් රථ භාවිත කරන්නන්ට වැඩි දියුණු කළ නැවතුම් මධ්‍යස්ථාන ඔස්සේ ආරක්ෂිත ගමනාන්තයකට ඉඩසලසා දෙනු ලැබේ.

මෙහි ඉලක්කය සරල ය:
විශේෂයෙන් පාසැල් සිසුන්, සේවකයින් සහ වැඩිහිටි අය වෙනුවෙන් ප්‍රවේශය පහසු, සුරක්ෂිත පොදු ප්‍රවාහන ක්‍රමයක් සලසා දීම මෙහි අරමුණයි.

**ප්‍රධාන පාර්ශවකරුවෝ**

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- පෞද්ගලික බස්රථ ක්‍රියාකරුවන්
- ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව
- කොළඹ මහ නගර සභාව
- රථවාහන පොලිසිය සහ ප්‍රවාහන අමාත්‍යාංශය
- මගීන්, රියදුරන් සහ කුඩා ව්‍යාපාර

**මාර්ගවල වත්මන් තත්ත්වය:**

- විශේෂයෙන් කාර්ය බහුල වේලාවන්හි දී, මගී තදබදය සහිත බස් රථ.
- දුර්වල නඩත්තුව, වායුසමනය, පිරිසිදුකම සහ විශ්වසනීයත්වයෙන් තොර බව.
- නිසි ආවරණ, ආලෝකකරණය හෝ තොරතුරු සන්නිවේදය රහිත බස් නැවතුම් පොළ.
- විශේෂිතව වෙන් කළ බස් මංතීරු නොමැතිකම: පුද්ගලික වාහන ආකාරයෙන්ම මාර්ග තදබදය තුළ සිරවී බස් රථ ධාවනය වීම.
- පෞද්ගලික හා ගමනාගමන මණ්ඩල බස්රථ ක්‍රියාකරුවන් අතර දුර්වල අනුකූලතා.
- අධි අවදානම් හරස් මාර්ග සහ අනාරක්ෂිත බස්රථ නැවතුම් ස්ථාන.

**දැනට අප සතු දෑ කවරේ ද?**

- බස් රථවලින් බහුතරයක් පැරණි හා අබලන් ඒවා ය.
- බස් කාලසටහන් පිළිබඳ සජීවී නිරීක්ෂණ හෝ ජංගම යාවත්කාලීන කිරීම් නොමැත.
- බස් නැවතුම්පොළ දුර්වල ලෙස නඩත්තු නොවන හෝ අනාරක්ෂිත තත්වයේ පවතින ඒවා ය.
- පාසැල් ආරම්භක සහ අවසාන කාල වේලාවන්හි දී හා කාර්යාල විවෘතව පවතින පැයවල දී අධික තදබදය.
- ප්‍රමුඛතා මංතීරු හෝ කාල පදනමක් මත රථවාහන ධාවනය සඳහා වූ ක්‍රම නොමැතිවීම.
- ආබාධිත ප්‍රවේශ පහසුව හෝ කාන්තා හිතකාමී පහසුකම් සීමා සහිත වීම.
- බස් මංතීරු විනය හා වේග සීමා දුර්වල ලෙස බලාත්මක කිරීම.
- අඩු ආදායම්ලාභී ජනාවාස සමඟ දුර්වල ප්‍රවාහන සම්බන්ධනය: ප්‍රධාන මාර්ග කරා ළඟා වීම සඳහා ළමුන්ට හා සේවක සේවිකාවනට දිගු දුරක් ඇවිදයාමට හෝ ත්‍රීරෝද රථවලට මුදල් ගෙවීමට සිදු වීම.

**අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?**

- මගී ආවරණ, ආලෝකකරණය සහ මාර්ග තොරතුරු සහිතව බස් නැවතුම් නවීකරණය කිරීම.
- පදික හරස් මාර්ග සහ සංඥා සහිතව බස් නැවතුම් අසල මාර්ග ආරක්ෂාව වැඩි දියුණු කිරීම.
- ගැටුම් වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල සහ පෞද්ගලික බස් මාර්ග සම්බන්ධීකරණය කිරීම.
- වඩා හොඳ මගී සේවයක් සඳහා රියදුරන් පුහුණු කිරීම සහ අධීක්ෂණය කිරීම.
- පාසල් ළමුන් සහ වැඩිහිටියන් සඳහා ආරක්ෂිත අවකාශ තැනීම.
- මාර්ග ගැටලු අවම කිරීම සඳහා බස් නැවතුම්වල දී පමණක් මගීන් පටවාගැනීම බලාත්මක කිරීම.
- අනතුරුදායක වංගු, වලවල් සහ හැරවුම් කලාප හඳුනාගෙන ඊට ප්‍රතිකර්ම ඇති කිරීම.
- කෙටි දුර පෝෂක බස් රථ සහ වෑන් රථ හඳුන්වා දීම මගින් ඌණ සේවා සැලසී ඇති ප්‍රදේශ සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම.

**අප හඳුන්වා දෙන නව අංග මොනවාද?**

- සජීවී බස් ස්ථාන, කාලවේලා සහ මාර්ග හඳුනා ගැනීමේ පහසුව සඳහා 'මූව් කළම්බෝ' නමින් ජාලගත යෙදුමක් ඇරඹීම.
- පැහැදිලි මං සලකුණු සහිතව අධික තදබදයක් ඇති ප්‍රවාහන කොරිඩෝර්වල විශේෂිත නියමු බස් මංතීරු ඇති කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයන් තුළින් විදුලි හා අඩු විමෝචන බස් රථ හඳුන්වා දීම.
- වර්ථමානයට ගැලපෙන ලෙස පැමිණීමේ වේලාවන් ප්‍රදර්ශනය කෙරෙන සුහුරු බස් නැවතුම් ස්ථාන ස්ථාපනය කිරීම.
- ප්‍රධාන බස් නැවතුම් ස්ථානවල ආරක්ෂක අංගයන් ද සහිතව කාන්තා ආරක්ෂිත කලාප පිහිටුවීම.
- ප්‍රමාද අවම කිරීම සඳහා මංසන්ධිවල දී බස් ප්‍රමුඛතා සංඥා සවි කිරීම.
- ප්‍රජා සම්බන්ධතා මාර්ග ආරම්භ කිරීම - විශේෂයෙන් පාසල් වේලාවන්හි දී, අඩු ආදායම්ලාභී නිවාස ප්‍රදේශ ප්‍රධාන බස් කොරිඩෝ වෙත සම්බන්ධ කරන කුඩා බස් රථ ධාවනයේ යෙදවීම.
- තදබදය අවම කිරීම සඳහා කාර්ය බහුල වේලාවනට හා බස් රථගමනාගමනයට ගැලපෙන සුහුරු ප්‍රවාහන ආලෝක පද්ධති ස්ථාපනය කිරීම.
- විදුලි වාහන සංචලතාවයට මාරුවීම සඳහා සහය වනු පිණිස ප්‍රධාන පොදු ප්‍රවාහන කලාපවල හා රථ ගාල් කිරීමේ කලාපවල මහ නගර සභාවට අයත් විදුලි ආරෝපණ මධ්‍යස්ථාන පිහිටුවීම.
- නගරය තුළ ඉහළ ජන ඝනත්වයක් සහිත කලාප අතර වේගවත් සම්බන්ධතා ඇති කරමින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සමඟ එක්ව කෙටි දුර, අධි වාර සංඛ්‍යාත දුම්රිය සේවාවක් හඳුන්වා දීම.

**ක්‍රමවේදයේ විනිවිදභාවය හා වගවීම ඇති කිරීම**

- ධාවන මාර්ගවල හා ධාවක ප්‍රතිපෝෂණ තොරතුරු පිළිබඳ මාසික කාර්ය සාධන සංඛ්‍යාලේඛන බෙදා හුවමාරු කර ගැනීම.
- ජාලගත යෙදුම හරහා මාර්ග සහ බස් සේවා පිළිබඳ පොදු සමාලෝචන සබල කිරීම.
- ක්‍රියාකරු වෙත මාර්ගයෙන් ලද පැමිණිලි විසඳා ඒවා ප්‍රකාශයට පත් කිරීම.
- සෑම කාර්තුවක් පාසාම ප්‍රතිපෝෂණ තොරතුරු සැසිවාර සඳහා මගීන් සම්බන්ධ කර ගැනීම.

# නිවැරදිව රථ ගාල් කිරීම හා නිදහස් ලෙස ගමන් බිමන් යාම

## කොළඹ නගරය තුළ වඩා සුහුරු, සාධාරණ හා අතිශය කාර්යක්ෂම නාගරික රථ ගාල් කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක්

දුර්වල ලෙස කළමනාකරණය කරන ලද රථ ගාල් කිරීමේ වැඩපිළිවෙළක් නගරයේ වීදි අවහිර කරයි. කාලය නාස්ති කර, සිත් කලකිරීම ඇති කරයි. නිවැරදිව රථ ගාල් කිරීම හා නිදහස් ලෙස ගමන් බිමන් කිරීම නමින් වූ වැඩපිළිවෙළ ඩිජිටල් ගෙවීම්, ගතික මිලකරණය සහ වඩා හොඳ බලාත්මක කිරීම යන ක්‍රියාවලිය පෙරටු කර ගත් නගරය තුළ වාහන ගාල් කිරීමේ කාර්යය විධිමත් කිරීම සඳහා වූ සුහුරු හා ප්‍රගමනීය මුලපිරීමකි. එමගින්නිර්මාණය කරනු ලබන්නේ, තදබදය අඩු කිරීම, පොදු ඉඩ අවකාශය නැවත ලබා ගැනීම සහ සෑම කෙනෙකුටම නගරය පුරා බාධා විරහිතව එහා මෙහා ගමන් කිරීම පිළිබඳව වූ ක්‍රියා පිළිවෙතකි.

### ප්‍රධාන පාර්ශවකරුවෝ

- කොළඹ මහ නගර සභාව - මංමාවත් ආශ්‍රිත වාහන නැවැත්වීම සහ ඇතැම් පොදු රථ ගාල් කිරීමේ පරිශ්‍ර කළමනාකරණය කරයි.
- පුද්ගලික වාහන ගාල් කිරීමේ ක්‍රියාකරුවන් - විශේෂයෙන් වාණිජ පරිශ්‍ර අසල පිහිටි ඉහළ ඉල්ලුමක් සහිත බිම් කඩ කීපයක් පාලනය කරයි.
- ශ්‍රී ලංකා පොලිසිය සහ රථවාහන අංශය - වාහන නැවැත්වීමේ රෙගුලාසි බලාත්මක කිරීමේ මෙහෙයුම් සහ නීති විරෝධී ලෙස වාහන නැවැත්වීම සම්බන්ධ මෙහෙයුම් කටයුතු ඉටු කරයි.
- නාගරික සංවර්ධන අධිකාරිය - ව්‍යුහාත්මක වාහන නැවැත්වීමේ වර්ධන කාර්යයන් අධීක්ෂණය කරයි.
- පොදු ප්‍රවාහනය භාවිතා කරන්නන් සහ කුඩා ව්‍යාපාර හිමිකරුවන් - වාහන ගාල් කර තැබීමේ දුර්වල සැලසුම් හේතුවෙන් බෙහෙවින් පීඩාවට පත් වන්නන්.

### වත්මන් රථ ගාල් කිරීමේ යටිතල නිර්මිතය

- මංමාවත් ආශ්‍රිත සීමිත රථ ගාල් කිරීම හා බැඳි අස්ථාවර නීති බලාත්මක කිරීම්.
- සෑම විටම ප්‍රවේශ විය නොහැකි හෝ දැරිය හැකි මිලක් සහිත පුද්ගලික පරිශ්‍ර.
- තථ්‍ය කාලීනව දැන ගත හැකි වාහන ගාල් කර තැබීම සඳහා වූ නගරය පුරා ප්‍රදර්ශනය වන ඩිජිටල් ක්‍රමවේදයක් නොමැත.
- නිරන්තර ද්විත්ව රථ ගාල්කරණය, මංතීරු අවහිර වීම සහ බාධක ඇති වීම.
- ව්‍යාපාර සඳහා නම් කරන ලද භාණ්ඩ පැටවීමේ / බෑමේ ඉඩ ප්‍රදේශ නොමැතිකම.

### දැනට අප සතු දෑ කවරේ ද?

- විසන්ධි ගත වූ සහ යල් පිනූ වාහන ගාල්කර තැබීමේ පද්ධති.
- දැනුවත්භාවය නොමැතිකම හෝ දුර්වල සැලසුම් හේතුකොට ගෙන බොහෝ ඉඩ අවකාශ නිසි ලෙස ප්‍රයෝජනයට ගෙන නැත.
- රියදුරන්ට වාහන නැවැත්වීම සොයා ගැනීමට කේන්ද්‍රීය යෙදුමක් හෝ වේදිකාවක් නොමැත.
- රථ ගාල් කිරීමේ අවිධිමත් සේවක පිරිස්, රිසිට්පත් නොදී හෝ වගවීමකින් තොරව මුදල් එකතු කරති.
- බඩු පැටවීම, පැදවුම් හුවමාරුව හෝ කෙටි නවතා තැබීම් සඳහා විශේෂ කලාප නොමැත.
- ද්විත්ව රථ ගාල්කරණ සිද්ධීන් හේතුවෙන් රථවාහන පොලීසිය අතිශය පීඩාකාරී ලෙස කාර්ය බහුල වේ.

## අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?

- වඩා හොඳ සංඥා සහ මංසලකුණු කිරීම් සහිතව නගරය පුරා ඒකාකාරී රථ ගාල් කිරීමේ නීති සැලසුම් කිරීම.
- වාණිජ ප්‍රදේශ තුළ බඩු පැටවීමේ කලාප සහ කෙටි කාලීනව වාහන නවතා තැබීමේ පරිශ්‍ර නම් කිරීම.
- රථ ගාල් කිරීමේ සේවක සේවිකාවන් නියාමනය කිරීම සහ පුහුණු කිරීම; හැඳුනුම්පත් ලාංඡන නිකුත් කර මුදල් රහිත ගාස්තු ගෙවීම් ක්‍රම ඇති කිරීම.
- ගතික මිලකරණය හඳුන්වා දීම - අතිශය කාර්ය බහුල ස්ථානවල තදබදය අඩු කිරීම සඳහා ඉල්ලුම අඩු පරිශ්‍ර වෙනුවෙන් අඩු මිල අනුපාත පිරිනැමීම.
- දෛනිකව නීති බලාත්මක කිරීම සහ සැලසුම් කිරීම සඳහා.කොළඹ මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය සහ පොලිසිය අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම.

## අප හඳුන්වා දෙන නව අංග මොනවාද?

- වාහන නවතා තැබීමේ ස්ථානවල තොරතුරු තථ්‍ය කාලීනව ලබා ගැනීමේ හැකියාව පෙන්වන 'පාක් ස්මාර්ට් කළම්බෝ' නමින් ජාලගත යෙදුමක් දියත් කිරීම .
- ඉඩ පරිශ්‍ර අවකාශ පරිහරණ හැකියාව හඳුනා ගැනීම සඳහා ප්‍රධාන වාහන නවතා තැබීමේ කලාපවල සුහුරු සංවේදක ස්ථාපනය කිරීම.
- ප්‍රවාහන කේන්ද්‍රස්ථාන අසල බහු මට්ටමේ රථ ගාල් (උදා.: මරදාන, කොටුව, ටවුන් හෝල්) තැනීම.
- නගර මධ්‍යයේ ගමනාගමන තදබදය අවම කිරීම සඳහා 'ගාල් කර පැද යන' පහසුකම් සකස් කිරීම.
- කාඩ්පත් සහ ඩිජිටල් ක්‍රම මගින් තථ්‍ය කාලීනව ටිකට්පත් හා රිසිට්පත් නිකුත් කොට ගෙවීම් කළ හැකි වන පරිදි ස්වයංක්‍රීය ලෙස වාහන නවතා තැබීමේ මීටර් කාර්ය බහුල ප්‍රදේශවල නැවත හඳුන්වා දීම හා වැඩි දියුණු කිරීම.
- ජනාකීර්ණ නේවාසික වීදිවල නේවාසික වාහන නවතා තැබීම සඳහා බලපත් හඳුන්වා දීම.
- ගෘහස්ත පෙදෙස් හා ප්‍රධාන ගමනාන්ත අතර ඉක්මන් හා තිරසර සංචලනය දිරි ගන්වමින් විදුලි පැදි හා කෙටි දුර විදුලි සංචලත්ව කලාප ප්‍රවර්ධනය කිරීම.

## දූෂණය හා අක්‍රමවත් කළමනාකරණය පිටුදැකීම

- අවිධිමත් මුදල් එකතු කිරීම් අවසන් කිරීම : කඩදාසි පත්‍රිකා සහ අතින් එකතු කරන ලද මුදල් වෙනුවට ඩිජිටල් ගෙවීම් සහ ලැබීම් ක්‍රම ආදේශකිරීම .
- බලපත් දීම සහ සේවකයින් අධීක්ෂණය : වාහන නැවැත්වීම සඳහා හැඳුනුම්පත් ලාංඡන සහිත පුහුණුව ලත් හා අනුමත කරන ලද පුද්ගලයින්ට පමණක් අවසර ලබා දීම.
- පොදු ටෙන්ඩර් ක්‍රියාවලිය: සියළුම බාහිර ප්‍රභවගත රථ ගාල් කිරීමේ කලාප ප්‍රකාශිත කොන්දේසි සහිතව විනිවිදභාවයෙන් යුතුව වෙන් කර දීම.
- මධ්‍යම ආදායම අධීක්ෂණය : රථ ගාල් කිරීම හා බැඳි සියලු ආදායම් අධීක්ෂණය කර ප්‍රසිද්ධියේ වාර්තා කිරීම.
- පුරවැසි වාර්තාකරණය : ජාලගත යෙදුම හරහා ව්‍යාජ ටිකට්පත් හෝ දූෂිත පිළිවෙත් කිසිවක් සම්බන්ධයෙන් ඍජුවම වාර්තා කිරීමට මහජනතාවට හැකි වීම.
- විගණනය සහ ආංශික අධීක්ෂණය: සෑම මාස 6 කට වරක් ම රථ ගාල් කිරීමේ මෙහෙයුම් ස්වාධීන විගණනයකට හසු කිරීම.

## ක්‍රමවේදයේ විනිවිදභාවය හා වගවීම ඇති කිරීම

- වාහන නවතා තැබීම, ආදායම සහ බලාත්මක කිරීම පිළිබඳ මාසික වාර්තා බෙදා ගනිමින් හුවමාරු කර ගැනීම.
- සියලුම නීතිමය රථ ගාල් කිරීමේ සහ රථ ගාල් කිරීම තහනම් කලාප පෙන්වීමට ඩිජිටල් සිතියම් භාවිතා කිරීම .
- වාහන නැවැත්වීමේ ගාස්තු ව්‍යුහ සහ දඩ මුදල් ආදායම් විවෘතව ප්‍රකාශයට පත් කිරීම .
- පැමිණිලි හෝ යෝජනා සඳහා වන ජාලගත යෙදුමේ පුරවැසි ප්‍රතිපෝෂණ තොරතුරු විශේෂාංග ඇතුළත් කිරීම .

# අද වියළි බව, හෙට ආරක්ෂිත බව

## කොළඹ නගරය තුළ ජලගැලීම් වැළැක්වීම, ජලාපවහනය ප්‍රතිසංස්කරණය කිරීම සහ දේශගුණිකව ඔරොත්තු දී සිටීම පිළිබඳ ප්‍රතිපත්තියක්

විශේෂයෙන් අඩු ආදායම්ලාභී හා ජලගැලීම් ගොදුරු කලාප ආශ්‍රිතව කොළඹ නගරය හා බැඳි අතිශය ආපදාකාරී අභියෝගවලින් එකක් වනුයේ, ගංවතුර තර්ජනයයි. 'අද වියළි බව, හෙට ආරක්ෂිත බව' යන වැඩපිළිවෙළ අවධානය යොමු කරන්නේ, අවහිර වූ කාණු සිහියම්ගත කිරීමටත්, ජල මාර්ග පිරිසිදු කිරීමටත්, ඊට සුහුරු සංවේදක හඳුන්වා දීමටත්, ජල සැපයුම් පද්ධති නඩත්තුව කැලි කසල පාලනය හා සම්බන්ධ කර පවත්වාගෙන යාමටත් අදාළ කාර්යභාරය කෙරෙහි ය. එය, පාසැල්, නිවාස සහ ජීවනෝපාය මාර්ග යනාදිය වාර්ෂිකව සිදු වන ජල ගැලීම් හානිවලින් ප්‍රථමකොට වළක්වා ගැනීමේ ප්‍රවේශයක් සහිත ප්‍රායෝගික ක්‍රියා මාර්ගයකි.

**ප්‍රධාන පාර්ශවකරුවෝ**

- කොළඹ මහ නගර සභාව
- නාගරික සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
- ප්‍රජා සාමාජිකයින් සහ ප්‍රාදේශීක කමිටු
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය
- ශ්‍රී ලංකා නාවික හමුදාව

**දැනට අප සතු දෑ කවරේ ද?**

- මලාපවහන පද්ධති ආවරණය කොළඹ නගරයේ භූමි ප්‍රමාණයෙන් 60% ක් පමණ වන අතර එයින් වැඩි  ප්‍රමාණයක් පැරණි වන අතර ඒවාටඅලුත්වැඩියා කටයුතු අවශ්‍ය වේ.
- බොහෝ පොම්පාගාර යල් පැන ගිය ඒවා වන අතර ඒවාට නිරන්තර යාන්ත්‍රික ගැටලු ඇති වේ.
- ඇළ මාර්ග ගණනාවක්ම කසල හා රොන්මඩ යනාදියෙන් හෝ නීති විරෝධී ඉදිකිරීම් මගින් දැඩිව අවහිර වී තිබේ.
- කාණු පද්ධති කලට වේලාවට පවිත්‍ර නොකිරීම හේතුවෙන් අධික වර්ෂාවක දී මහ මාර්ග ඉතා ඉක්මනින් ජලයෙන් යටවේ.
- අවිධිමත් ජනාවාස ආශ්‍රිතව නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධති නොමැති අතර අනාරක්ෂිත විකල්ප මත ඒවා රඳා පවතී.
- සීමිත ප්‍රජා සන්නිවේදනය, ගංවතුර ප්‍රතිචාර දැක්වීමේ ප්‍රතික්‍රියාවලට සීමා වන නමුත් ඉන් ඒවා වළක්වා ගත හැකි නොවේ.

**අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?**

- පැරණිතම කලාපවලින් ආරම්භ කර දැනට පවතින අපද්‍රව්‍ය බැහැර මාර්ග යාවත්කාලීන කිරීම සහ අළුත්වැඩියා කිරීම.
- වඩා හොඳ නඩත්තු කාලසටහන් සහ පුහුණු කාර්ය මණ්ඩලයක් සහිතව පොම්පාගාර නවීකරණය කිරීම.
- අපද්‍රව්‍ය කළමනාකරණ කණ්ඩායම් සමඟ හවුල්කාරීත්වයෙන් යුතුව මාසිකව ඇළ මාර්ග පිරිසිදු කිරීම.
- නියෝජිතායතන (කොළඹ මහ නගර සභාව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය සහ, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව) අතර සම්බන්ධීකරණය හවුල් ක්‍රියාකාරි විද්‍යුත් ඩෑෂ්බෝඩ් පුවරුවක් හරහා වැඩි දියුණු කිරීම.
- කාණු පැහැදිලි කර ගැනීම සඳහා ගංවතුර වැළැක්වීමේ කණ්ඩායම් සමඟ එක්ව එම කාර්යය ඝන අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ කටයුත්තටසම්බන්ධ කිරීම.
- කුඩා පරිමාණ සනීපාරක්ෂක කේන්ද්‍ර භාවිතා කරමින් ඌණ සේවා සැලසි ජනාවාසවල අපද්‍රව්‍ය පද්ධති සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම.
- නීතිවිරෝධී කසල බැහැර ස්ථාන සහ නියාමනය නොකළ සම්බන්ධතා පිළිබඳ පරීක්ෂණ වැඩි කිරීම.

සතුටින් පිරි කොළඹ පුරවරයකට

## අප හඳුන්වා දෙන නව අංග මොනවාද?

- කලින් අනතුරු ඇඟවීම් දැනුම් දීම සඳහා දඩි බලපෑම් සහිත ස්ථානවල ජල ගැලීම් හඟවන සංවේදක සහ ජල මට්ටම අධීක්ෂණය කිරීමේ යන්ත්‍ර ස්ථාපනය කිරීම.
- ජල ගැලීම්වලට ලක්වන ප්‍රදේශ සහ හෙළි පෙහෙළි කළ කාණු පද්ධති කලාප තථ්‍ය කාලීනව පෙන්වන කොළඹ නගරය ආශ්‍රිත ජල ගැලුම් මුක්ත ප්‍රදේශ ඉස්මතු කෙරෙන පොදු සිතියමක් සැකසීම.
- අවහිර වූ හෝ කැඩුණු කාණු පද්ධති පිළිබඳව පුරවැසියන්ට වාර්තා කළ හැකි නගරය පුරා භාවිතයට ගත හැකි ජලාපවහන පරීක්ෂණයට හසු කිරීමේ අන්තර්ජාල යෙදුමක් හඳුන්වා දීම.
- 24/7 කාලය පුරාවටම නිෂ්කාශන ධාරිතාවෙන් සජ්ජිත යුහුසුළුව ප්‍රතිචාර දැක්විය හැකි ජලාපවහන පද්ධති කණ්ඩායම් සියලු අධි අවදානම් සහිත ප්‍රදේශවල ඇති කිරීම.
- පූර්ව අනතුරු ඇඟවීම් සහ හදිසි සහාය සැලසීම පිළිබඳ පුහුණුව ලබා ඇති ප්‍රජා ජල ගැලුම් නියාමකයන්  පහත් බිම් ප්‍රදේශ ආශ්‍රිතව සූදානමින් තැබීම.
- ප්‍රාදේශික අපද්‍රව්‍ය ආරක්ෂිතව කළමනාකරණය කිරීම සඳහා අවිධිමත් ජනාවාසවලට සමීපව කුඩා පවිත්‍රාගාර පහසුකම් ඇති කිරීම.

## ක්‍රමවේදයේ විනිවිදභාවය හා වගවීම ඇති කිරීම

- ජලාපවහන, මලාපවහන සහ ගංවතුර ප්‍රතිචාර දැක්වීමේ ව්‍යාපෘති පිළිබඳ මාසික යාවත්කාලීන කිරීම් ප්‍රකාශයට පත් කිරීම.
- ප්‍රගතිය සහ අධි අවදානම් කලාප පෙන්වීම සඳහා සුහුරු සිතියම් සහ විද්‍යුත් ඩෑෂ්බෝඩ් උපකරණ පුවරු භාවිතා කිරීම.
- ඇළ මාර්ග පිරිසිදු කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා නාගරික කොට්ඨාස මට්ටමේ ඉලක්ක හඳුන්වා දීම.
- මහජනයා සමඟ පරීක්ෂණ වාර්තා සහ ඒවා පිළිබඳ ප්‍රගතිය බෙදා හුවමාරු කර ගැනීම.
- අධීක්ෂණය හා නඩත්තු කිරීමේ කාර්යයන්හිලා ජංගම වාර්තාකරණය තුළින් ජන ප්‍රජාව සම්බන්ධ කර ගැනීම.

# අනාගතය ගොඩනගන රැකියා

## කොළඹ නගරයේ තරුණ තරුණියන් කුසලතා පූර්ණ, උපදේශකත්වය සහිත, සැබෑ අවස්ථා හිමි තැනැත්තන් ලෙස  සවිබල ගැන්වීමේ ප්‍රතිපත්තියක්

තරුණ විරැකියාව කොළඹ නගරය තුළ වඩාත් හදිසි සමාජ ගැටලුවලින් එකකි. නමුත්, ඊට පිළිතුර රජයේ රැකියා වැඩි කිරීමම නොවේ. එය, සැබෑ අවස්ථා වඩාත් සුලභ කිරීමක් වන්නේ ය. 'අනාගතය ගොඩනගන රැකියා' වැඩපිළිවෙළ තුළින් තරුණ තරුණියන් යම් ආදායම් මාර්ගයක් හා අරමුණක් වෙත සම්බන්ධ කිරීම සඳහා නිපුණතා වර්ධනය කර ගැනීමේ මාර්ග ධාරාවක් ද, ක්ෂුද්‍ර ව්‍යාපාර සහාය සැලසීමක් ද, රැකියා සම්බන්ධ කර දෙන කාර්යාලයක් ද, දේශීය සේවා යෝජකයන් සමඟ හවුල්කාරීත්වයක් ද බිහි කර දෙයි. මෙය වූ කලී, කොළඹ නගරයේ වෙසෙන තරුණ තරුණියන්ට තම නගරය හැරයාමකින් තොරව සාර්ථක වීම සඳහා ඔවුනට අවශ්‍ය නිසි මෙවලම් ඔවුන් වෙත ලබා දීමේ ව්‍යායාමයකි.

**ගැටලුව**

- කොළඹ නගරයේ බොහෝ යෞවන යෞවනියන් - විශේෂයෙන් අඩු ආදායම්ලාභී ප්‍රදේශවල වෙසෙන්නන්, - පාසැල් ඉගෙනුම අවසන් කර හෝ අතහැර දමා හෝ වැඩ කිරීම සඳහා පැහැදිලි මාවතක් නොමැතිව හෝ සිටින්නන් ය.
- ප්‍රාදේශිකව රැකියා සඳහා ඇති අවස්ථා අල්ප ය. කර්මාන්තවලට නිරාවරණය වීනු පිණිස ඇත්තේ සීමිත ඉඩකඩකි. එමෙන්ම, රැකියා හෝ ඊට අදාළ පුහුණුව ලබා ගැනීමට කිසිදු උපකාරක ක්‍රමවේදයක් ද ඔවුනට   නොමැත.
- මෙය, ඔවුන් මත්ද්‍රව්‍ය හා අපරාධ කෙරෙහි නැඹුරු වීමට ද, ඉච්ඡාභංගත්වයට ගොදුරු වීමට ද බලපායි.
- රජයේ රැකියා සීමිත වන අතර ඊට කෙරෙන වැඩි එකතු කිරීම් ද මූල්‍යමය වශයෙන් තිරසාර නොවේ.

**දැනට අප සතු දෑ කවරේ ද?**

- නගරය විසින් පවත්වාගෙන යනු ලබන මූලික පුහුණු වැඩසටහන්, බොහෝ විට යල් පිනූ ඒවා ය.
- පුද්ගලික සමාගම් කීපයක් සීමාවාසික පුහුණුව ලබා දුන්න ද, බොහෝ දෙනෙකු හට ඒවා කරා ලඟා විය නොහැකි ය.
- රාජ්‍ය නොවන සංවිධාන සහ පුණ්‍යායතන සම්බන්ධීකරණයක් රහිත යොවුන් කටයුතු ඉටු කරයි.

**අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?**

- අර්ධකාලීන හා ආධුනිකත්ව රැකියා අවස්ථා ලබා දීම සඳහා ව්‍යාපාර (සාප්පු, බෙදා හැරීමේ සමාගම්, කාර්මික ශිල්පීන්, රූපලාවණ්‍යාගාර, කාර්මික සමාගම් යනාදිය) හවුල් කර ගැනීම.
- සෑම නාගරික කොට්ඨාසයකම සිටින රැකියා සොයන තරුණ තරුණියන් හඳුනා ගැනීම.
- රැකියා සූදානමක් සහිත නිපුණතා තුළ තරුණ තරුණියන් පුහුණු කිරීම (බෙදා හැරීමේ යෙදුම්, පාරිභෝගික සේවය, ඉදිකිරීම්, ආරක්ෂාව, රැකබලා ගැනීමේ සේවා, පිරිසිදු කිරීමේ සේවා, ඉලෙක්ට්‍රොනික වැඩ සහ මේසන් වැඩ  යනාදිය).

**අප හඳුන්වා දෙන නව අංග මොනවාද?**

1. සෑම සෑම නාගරික කොට්ඨාස කාර්යාලයකම රැකියා සම්බන්ධීකරණ කාර්යාංශ

   - පවතින රැකියා, නිපුණතා වැඩසටහන් සහ උපදේශනය සඳහා තරුණ තරුණියන්ට ලියාපදිංචි විය හැකි පොදු කවුන්ටරයකි.
   - ප්‍රාදේශික ව්‍යාපාර ලේඛන ලැයිස්තු හා පුහුණු මධ්‍යස්ථාන සමඟ සම්බන්ධ වේ.

2. කොළඹ කුසලතා බලපත

   - සම්පූර්ණ පුහුණුව හා සේවා පළපුරුද්ද පෙන්වන නගරය විසින් සත්‍යාපනය කරන ලද සරල, භෞතික හෝ ඩිජිටල් කාඩ්පතක්.
   - විධිමත් අධ්‍යාපනයකින් තොරව වුව ද තරුණ තරුණියන්ට විශ්වාසනීයත්වය ගොඩනැගීමට උපකාරී වේ.

3. තරුණ වැඩ කේන්ද්‍රස්ථාන

   - ප්‍රාදේශික නිපුණතා පුහුණු කටයුතු පවත්වා ගෙන යාම සඳහා ප්‍රජා මධ්‍යස්ථාන හෝ පන්සල් / දේවස්ථාන / පල්ලි සමඟ සෑම මාසයක දීම හවුලේ ක්‍රියා කිරීම.
   - රැකියා උපදේශනය හෝ "රැකියා අත්හදා බැලීම්" පිරිනැමීමට කුඩා ව්‍යාපාරවලට ආරාධනා කිරීම.

4. තරුණ දක්ෂතා දින

   - යෞවනයන් හමුවී ඔවුන්ගේ කුසලතා (තාක්ෂණික නිරූපණ ඉදිරිපත් කිරීම්, ශිල්පීය හැකියා, කුඩා ව්‍යාපාර) දැක බලා ගැනීමටපැමිණෙන සමාගම් සමඟ සෑම කලාපයකම මාසික මුණගැස්වීමක් සිදු කිරීම සහ එහිදී අර්ධකාලීන රැකියා පිරිනැමීම.

5. ක්ෂුද්‍ර ව්‍යවසාය ප්‍රවර්ධනය කිරීම

   - බාබර් වැඩ, ඇඳුම් මැසීමේ වැඩ, බයිසිකල් අළුත්වැඩියා කිරීම, ජංගම දුරකථන සවි කිරීම යනාදී සේවා ආරම්භ කිරීමේ උවමනාවෙන් පසුවන තරුණ තරුණියන් වෙනුවෙන් කුඩා ප්‍රදාන හෝ උපකරණ (මුදල් නොවන) පිරිනැමීම.
   - තරුණ තරුණියන්ට උපදේශනය ලබාදීමට සහ ඔවුන්ට මඟ පෙන්වීම සඳහා ස්ථාපිත වෙළඳසැල් සමඟ හවුලේ ක්‍රියා කිරීම.

# සුහුරු නගරයක්, පවිත්‍ර පද්ධතියක්

## විනිවිදභාවයෙන් යුතු, දූෂණයෙන් තොර ඩිජිටල් කොළඹ නගරයක් ගොඩ නැගීම පිළිබඳ ප්‍රතිපත්තියක්

නගර සේවාවල පවත්නා දූෂණය, ප්‍රමාදය සහ අකාර්යක්ෂමතාව මහජන විශ්වාසය බොහෝ දුරට පළුදු කර ඇත. 'සුහුරු නගරයක්, සුපවිත්‍ර පද්ධතියක්' වැඩපිළිවෙළ තුළින් සියලු අවසර පත්, ගෙවීම් කටයුතු, සේවා පිළිබඳව සෙවිල්ලෙන් සිටීම් සහ සේවා සැපයීම් සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණයට හසු කිරීම මගින් යල් පැන ගිය, කඩදාසි මත යැපෙන පාලනය විෂයයෙහි අවසානයක් සනිටුහන් වේ. මෙම මුලපිරීම හරහාවිනිවිදභාවය, වගවීම සහ ප්‍රවේශය සහතික කෙරේ. එබැවින්, තම මුදල් කවර ස්ථානයක් වෙත යනවා ද, තම සභාව තමන්ට කෙළෙස සේවය සලසනවා ද යනුවෙන් පුරවැසියන්ට දැක බලා ගත හැකි ය.

### දැක්ම

වෙහෙස නොබලා වැඩ කරන ස්වකීය ජනතාව මෙන් ක්‍රියා කරන නගර සභාවක් දිනා ගැනීම සඳහා කොළඹ නගරය වරම් ලබා ඇත. අද, දූෂණය,ප්‍රමාදවීම් සහ සැඟවුණු යටිකූට්ටු ගනුදෙනු ප්‍රගතියේ මාවත් වසා දමා ඇත. සෑම සේවාවක්ම, සෑම අනුමැතියක්ම හා වියදම් කරන සෑම රුපියලක්ම ඩිජිටල්කරණය කිරීමෙන් අපි මෙම තත්වය නිවැරදි කරන්නෙමු. මෙම මුලපිරීම මගින් කොළඹ මහ නගර සභාව පත්‍ර කඩදාසි රහිත, ජනතාභිමුඛ හා සම්පූර්ණයෙන්ම නිරීක්ෂණයට භාජනය කළ හැකි සේවා පද්ධතියක් බවට පත් කෙරෙනු ඇත.

### ප්‍රධාන අරමුණු

- කාර්යක්ෂමතාව - ප්‍රමාද හෝ පත්‍ර කඩදාසිවලින් කෙරෙන කටයුතු විරහිත කඩිනම් සේවා.
- විනිවිදභාවය - පුරවැසියන් හට සෑම රුපියලක්ම සහ තීරණයක්ම සම්බන්ධයෙන් සෙවිල්ලේ සිට නිරීක්ෂණය කළ හැකි ය.
- දූෂණ විරහිත බව - අතරමැදියන්ට, නිල නොවන ගෙවීම්වලට හෝ සැඟවුණු ලිපිගොනු සඳහා ඉඩක් නැත.

### දන් සිදු වන දූෂණය හා ප්‍රමාදය

දූෂණයට, අනුග්‍රහපූර්වකත්වයට සහ අකාර්යක්ෂමතාවයට ගොදුරු වන සභාවේ ප්‍රධාන කාර්ය ක්ෂේත්‍ර යට දක්වේ.

1. බලපත්‍ර සහ අනුමත කිරීම් (උදා. : ගොඩනැගිලි පර්මිට් පත්‍ර, ව්‍යාපාර බලපත්)
2. කොන්ත්‍රාත්තු ප්‍රදාන හා ප්‍රසම්පාදන
3. පොදු වෙළඳ කුටි බෙදා දීම
4. කසළ එකතු කිරීම සහ වීදි නඩත්තු අධීක්ෂණය
5. ආදායම් එකතු කිරීම සහ ගාස්තු ගෙවීම්
6. පුරවැසි පැමිණිලි සහ සේවා ඉල්ලීම්

### ඩිජිටල් මහ නගර සභාවේ විසඳුම්

1. මාර්ගගත බලපත් සහ අනුමත කිරීමේ පද්ධතිය
    - ගොඩනැගිලි අනුමත කිරීම්, වෙළඳ බලපත් හා විකුණුම් ස්ථාන යනාදිය සඳහා මාර්ගගතව අයදුම් කිරීම.
    - යොමු අංක සමඟ අයදුම්පත් පිළිබඳව සෙවිල්ලෙන් සිට ඊට අදාළ කාල වකවානු ප්‍රසිද්ධියේ බලා ගැනීම.
    - කෙටි පණිවුඩ / විද්‍යුත් තැපැල් යාවත්කාලීන කිරීම් හරහා ප්‍රමාද වූ ලිපිගොනු ස්වයංක්‍රීව ප්‍රතික්ෂේප වීම.

2. ඩිජිටල් ඉඩම් සහ නිවාස රෙජිස්ටර් කාර්යාලය
    - සියලුම අයදුම්පත් පැහැදිලි, පොදු නිර්ණායක (ආදායම, පවුල් ප්‍රමාණය, හදිසි අවශ්‍යතාව) මත ලකුණු රැස් කර ගැනේ.
    - මාර්ගගත අයදුම්පත සහ විනිවිද පෙනෙන පොරොත්තු පෝලිම්.
    - අතරමැදියන් හෝ පෞද්ගලිකව ලිපිගොනු හැසිරවීමක් නොමැත.

3. ඊ- ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්තුවල විනිවිදභාවය
    - සියලුම ටෙන්ඩර් සම්පූර්ණ කාල සීමාවන් සහ ලේඛන සමඟ අන්තර්ජාලය හරහා ප්‍රකාශයට පත් කෙරේ.
    - ජයග්‍රාහී කොන්ත්‍රාත්කරු, ව්‍යාපෘති පිරිවැය සහ කාලසීමාව ප්‍රසිද්ධියට පත් කෙරේ.
    - ව්‍යාපෘති වැඩබිම්වල QR කේත පිරිවැයට සහ තත්ව තොරතුරුවලට සම්බන්ධ වේ.

4. සාධාරණ වෙළෙඳාම් සහ වෙළඳ කුටි පද්ධතිය
    - වෙළඳ කුටි වෙන්කිරීම් සඳහා ඩිජිටල් ලොතරැයිය.
    - පැහැදිලි හා මැනිය හැකි කාර්ය සාධනය මත පදනම් වූ වාර්ෂික අලුත් කිරීම්.
    - නිල නොවන ගෙවීම් හෝ අනුග්‍රහයන් සඳහා ශුන්‍ය ඉවසීම.

5. පොදු වැඩ පිළිබඳව තථ්‍ය කාලීනව විමසිල්ලෙන් සිටීම
    - කසල ට්‍රක් රථ, කාණු පිරිසිදු කිරීමේ කණ්ඩායම් සහ වීදි අතුගෑමේ යෙදෙන්නන් සඳහා GPS නිරීක්ෂණය.
    - සේවා සැපයීම අධීක්ෂණය කිරීම පිණිස පදිංචිකරුවන් සඳහා සජීවී උපකරණ පුවරු (ඩෑෂ්බෝඩ්).
    - මගහැරුණු කසල එකතු කිරීම් හෝ අසාධු සේවා පිළිබඳව WhatsApp මගින් වාර්තා කිරීම.

6. මුදල් රහිත ගෙවීම් පමණි.
    - සියලුම ගාස්තු, දඩ මුදල්, කුටි කුලී සහ බලපත් ගෙවීම් ඩිජිටල්ගත කෙරේ.
    - සේවා ඉටු වන ස්ථානවල මුදල් හැසිරවීමක් නොමැත.
    - ලදුපත් ක්ෂණිකව නිකුත් කෙරෙන අතර පොදු අයකිරීම් වාර්තාවල ඒවා දෘෂ්‍යමාන වේ.

7. පුරවැසි ප්‍රතිපෝෂණ තොරතුරු හා පැමිණිලි පිළිබඳ පොදු විවෘත ද්වාර
    - සේවා ඉල්ලීම් සහ පැමිණිලි සඳහා මාර්ගගත සහ ජංගම වේදිකාව.
    - යාවත්කාලීන කිරීම් සහිත  නිරීක්ෂණය කළ හැකි පැමිණිලි කිරීමේ හැඳුනුම්පතක්.
    - නොවිසඳුනු කරුණු සඳහා යුහුසුළු ක්‍රියාකිරීම්.
    - එක් එක් නාගරික කොට්ඨාසය සඳහා මාසික කාර්යසාධන ලකුණු පුවරුව.

8. මහජන පැමිණිලි කළමනාකරණ පද්ධතිය
    - පැමිණිලි හෝ සේවා ඉල්ලීම් මාර්ගගතව හෝ සිංහල, දෙමළ, හෝ ඉංග්‍රීසි යන භාෂාවලින් ජංගම දුරකථන හරහා ඉදිරිපත් කිරීම.
    - කෙටි පණිවුඩ / විද්‍යුත් තැපැල් යාවත්කාලීන කිරීම් සහිතව අනන්‍ය යොමු අංකයක් භාවිතා කරමින් පැමිණිලිකිරීම්වල තත්ත්වය නිරීක්ෂණය කිරීම.
    - නොවිසඳුනු කාරණා සඳහා ස්වයංක්‍රීය සීඝ්‍රත්වය සහ පැහැදිලි කාලානුගත ක්‍රියා කිරීම.

**මහජනයා දකින දේ කවරේ ද ?**

- නගර සභා වෙබ් අඩවිවල සහ දර්ශන තිර මත පොදු විද්‍යුත් ඩෑෂ්බෝඩ් පුවරු
    - දෙපාර්තමේන්තුව විසින් වියදම් කිරීම.
    - පැමිණිලි ලැබී ඇති අතර විසඳා ඇත.
    - සජීවී ලෙස ව්‍යාපෘති යාවත්කාලීන කිරීම්.
    - කසල සහ නඩත්තු ක්‍රියාකාරකම් දැක්වෙන සිතියම්

# සෞඛ්‍ය සම්පන්න කොළඹක් - සවිමත් ජීවිතයක්

## කොළඹ නගරයේ සෑම ගෘහකාණ්ඩ ප්‍රදේශයක් වෙතම සෞඛ්‍යාරක්ෂණය ගෙනයාම පිළිබඳ ප්‍රතිපත්තිය

යහපත් සෞඛ්‍යය මූලික අයිතියක් වේ. එය, ස්වල්ප දෙනෙකුට සීමා වූ වරප්‍රසාදයක් නොවේ. 'සෞඛ්‍ය සම්පන්න කොළඹ නගරයක් හා සවිමත් ජීවිත' නමින් වන වැඩපිළිවෙළ තුළින් මහජන රෝග සායන ශක්තිමත් කිරීමටත්, මිල දැරිය හැකි සත්කාර සඳහා වූ ප්‍රවේශය වැඩි දියුණු කිරීමට සහ සියලු නාගරික කොට්ඨාස සිසාරා ප්‍රජා සුවතාවය උදෙසා සහය වීමටත් අරමුණු කර ගනු ලැබ තිබේ. රෝග වළක්වා ගැනීම, අභිමානය සහ නාගරික කොට්ඨාස මට්ටමේ සේවාවන් කෙරෙහි අවධානය යොමු කිරීම සහිතව, මෙම මුලපිරීම සෑම ගෘහකාණ්ඩ කලාපයක් වෙතම ගුණාත්මක සෞඛ්‍ය සේවා සමීප කර දෙයි.

**ගැටලුව**

- කොළඹ අඩු ආදායම්ලාභී ප්‍රදේශවල වෙසෙන බොහෝ පවුල් මූලික සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය ලබා ගැනීමේ අසීරුතාවකට මුහුණ දෙති.
- රජයේ රෝහල් රෝගීන්ගෙන් පිරිතිරී පවතී. කාර්ය මණ්ඩල හිඟයකට ද මුහුණ පා සිටී. එම රෝහල් මිනිසුන් වෙසෙන ස්ථානවලට බොහෝ සෙයින් දුරස්ථව පිහිටා ඇති ඒවා වේ.
- දිගු ගමන් කාලය, ඉහළ ප්‍රවාහන වියදම්, මග හැරෙන වැඩ පැය ගණන යනාදී කරුණු, කල් වේලා ඇතිව තම රෝග සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට මිනිසුන්ව අධෛර්යමත් කරයි. මෙම තත්වය විශේෂයෙන් මව්වරුන්, ළමුන් සහ වැඩිහිටියන් විෂයයෙහි අදාළ වේ.
- පෞද්ගලික රෝගී සායන මිල අධික වන අතර බොහෝ ගෘහකාණ්ඩ ප්‍රදේශවල රෝග නිවාරණය හෝ විවිධ රෝග පිළිබඳව දැනුවත්භාවයක්නොමැත.

**දැනට අප සතු දෑ කවරේ ද?**

- මධ්‍ය වශයෙන් වැදගත් ස්ථානවල පිහිටි විශාල රජයේ රෝහල් (උදා.:. ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල)
- ප්‍රතිශක්තිකරණය සහ මාතෘ සෞඛ්‍ය සඳහා වූ කුඩා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල.
- රෝගීන් සඳහා කඩින් කඩ වෛද්‍ය කඳවුරු සහ ජංගම සායන පවත්වන රාජ්‍ය නොවන සංවිධාන.
- කොළඹ මහ නගර සභාවට අයත් බෙහෙත්ශාලා (බටහිර හා පාරම්පරික වෙදකම්)

**අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?**

1. ඌණ සේවා සැලසී ප්‍රදේශවල වැඩි වශයෙන් පැවැත්විය යුතු ජංගම සායන
   - රෝග පරීක්ෂා කිරීම, මාතෘ සත්කාර, දියවැඩියා සහ රුධිර පීඩන පරීක්ෂා මෙන්ම මූලික රෝග සායන ද සලසන නිත්‍ය ජංගම සෞඛ්‍ය සේවා ඒකක පැවැත්වීම සඳහා විශ්ව විද්‍යාල හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ හවුලේ ක්‍රියා කිරීම.
   - අඩු ආදායම් ජනාවාස කෙරෙහි අවධානය යොමු කිරීම.

2. ප්‍රාදේශීය සෞඛ්‍ය ස්වේච්ඡා සේවකයන් පුහුණු කිරීම.
   - ප්‍රජාව තුළ වෙසෙන කාන්තාවන් සහ තරුණ තරුණියන් තෝරාගෙන මූලික සෞඛ්‍ය සහය සැපයීම සඳහා පුහුණු කිරීම: ප්‍රථමාධාර, ඖෂධ පාවිච්චිය පිළිබඳව සිහිපත් කිරීම් සහ ප්‍රතිකාර සඳහා යොමු කිරීම්.
   - මෙම ස්වේච්ඡා සේවකයන් අධීක්ෂණයක් යටතේ තම සේවා ඉටු කරමින් පවුල් සහ වෛද්‍ය සායන අතර පරතරය පියවා ගැනීම සඳහාඋපකාරී වනු ඇත.

3. ගෘහකාණ්ඩය තුළ කුඩා සෞඛ්‍ය කාර්යාංශ
   - නාගරික කොට්ඨාස කාර්යාලවල හෝ ප්‍රජා මධ්‍යස්ථානවල දී පහත සේවා ජනතාවට සලසා ගත හැකි සරල සෞඛ්‍ය කවුන්ටර සකස් කිරීම:
     - මූලික උපදෙස් ලබා ගැනීම.
     - දිගුකාලීන ඖෂධ ප්‍රතිකාරවල අඩුව නැවත පිරවීම (රුධිර පීඩනය, දියවැඩියාව)
     - ළඟම ඇති වෛද්‍ය සායනවලට හමුවීම් වෙන්කර නියම කර ගැනීම.

සතුටින් පිරි කොළඹ පුරවරයකට

**අප හඳුන්වා දෙන නව අංග මොනවාද?**

1. කොළඹ සෞඛ්‍ය කාඩ්පත

- අඩු ආදායම්ලාභී පවුල් සඳහා සරල හැඳුනුම්පතක් (භෞතික හෝ ඩිජිටල්):
    - එන්නත් හා බෙහෙත් වට්ටෝරු පිළිබඳව සෙවිල්ලෙන් සිටීම.
    - හවුල් සායනවල දී නොමිලේ සේවා ප්‍රවේශය ලබා ගැනීම.
    - ජංගම සායන හමුවීම් සහ පසු විපරම් තොරතුරු සඳහා ලියාපදිංචි වීම.

2. මාර්ගගත සෞඛ්‍ය නිරීක්ෂකය

- නගරය විසින් පවත්වා ගැනෙන සෞඛ්‍ය ඩෑෂ්බෝඩ් විද්‍යුත් පුවරුව (ප්‍රාදේශීය කාර්යාලවල ද ප්‍රදර්ශනය කෙරේ) පහත සඳහන් කරුණු පෙන්වයි:
    - ඉදිරියට පවත්වන ගාස්තු රහිත වෛද්‍ය සායන.
    - එක් එක් කලාපයට පොදු සෞඛ්‍ය ගැටලු.
    - සේවා ලබා ගත හැකි රෝගීන්ගේ සංඛ්‍යාව.

3. හදිසි ප්‍රතිචාර පුහුණුව

- ස්වේච්ඡා සේවකයන්, ත්‍රීරෝද රථ රියදුරන්, ගුරුවරුන් සහ සාප්පු හිමියන් සඳහා මූලික ප්‍රථමාධාර සහ සීපීආර් භාවිතය පිළිබඳව පුහුණුව.
- ගිලන්රථ සඳහා දුර්වල ප්‍රවේශයක් ඇති ප්‍රදේශවල හදිසි සෞඛ්‍ය තර්ජනවලින් ඇතිවන මරණ සිදුවීම් අඩු කර ගැනීමට උපකාරී වේ.

4. මාතෘ සහ ළමා සෞඛ්‍ය පිළිබඳ අවධානය
- සායන සහ ජංගම සේවාවන් හරහා ගර්භනී කාන්තාවන් සහ කුඩා දරුවන් සඳහා නොමිලේ පෝෂණ ඇසුරුම් සහ විටමින් වර්ග.
- රක්තහීනතාවය, මන්දපෝෂණය සහ ශ්වසන ආබාධ සඳහා කල් වේලා ඇතිව පරීක්ෂා කර ගැනීම.

# නගරයේ වෙසෙන කාන්තාවගේ අයිතිය

## කොළඹ නගරයේ කාන්තා ආරක්ෂාව, ඇයගේ සනීපාරක්ෂාව සහ අභිමානය පිළිබඳ ප්‍රතිපත්තිය

කොළඹ නගරයේ සෑම අස්සක් මුල්ලක් නැර නිදහසේ ගමන් කිරීමටත්, ආරක්ෂිතව වැඩ කිරීමටත්, සුරැකිව සිටින බවට තමාට හැඟෙන්නටත් ඇයට අයිතියක් හා හිමිකමක් තිබේ. 'නගරයේ වෙසෙන කාන්තාවගේ අයිතිය' යන වැඩපිළිවෙළ, ආලෝකකරණය, ආරක්ෂිත වැසිකිළි, වාර්තාකරණ පද්ධති සහ විවේකය හා උපකාරය සඳහා වූ ප්‍රජා කේන්ද්‍ර කෙරෙහි ප්‍රමුඛත්වය දෙන කාන්තා ආරක්ෂාව සහ අභිමානය පෙරදැරි කර ගත් මූලාරම්භයකි. එය, ඇගේ පසුබිම කුමක් වුවත්, සෑම කාන්තාවක්ම තමන් ආරක්ෂිත බවටත්, තමාට ගෞරවාන්විතව සලකන බවටත්, තමන් සවිබල ගැන්වෙන බවටත් ඇයට හැඟෙන හා දැනෙන නගරයක් නිර්මාණය කිරීම සඳහා කැපවූ බැඳීමකි.

**ගැටලුව**

- කොළඹ බොහෝ කාන්තාවන්, විශේෂයෙන් අඩු ආදායම්ලාභී ප්‍රදේශවල වෙසෙන්නන්, වීදිවල, බස් රථවල සහ ඔවුන්ගේම ගෘහකාණ්ඩ වටපිටාව තුළ දෛනික තර්ජනයන්ට මුහුණ පායි.
- විශේෂයෙන්ම, ඔසප් වීම හෝ ගැබ් දරන කාල තුළ බොහෝ විට පොදු වැසිකිළි හා සනීපාරක්ෂාව  අනාරක්ෂිත හෝ භාවිතයට ගත නොහැකි වේ.
- හිරිහැරදායක බව, ප්‍රචණ්ඩත්වය හෝ මානසික ආතතියට මුහුණ දෙන කාන්තාවන් වෙනුවෙන් ආරක්ෂිත අවකාශයක් හෝ ආධාරක පද්ධති ඇත්තේ ඉතා අල්පයකි..
- අවිධිමත් අංශවල වැඩකරන කාන්තාවන්ට සහ තරුණ ගැහැණු ළමුන්ට බොහෝ විට නිසි ආරක්ෂාවක් හෝ සම්පත් නොමැත.

**දැනට අප සතු දෑ කවරේ ද?**

- සමහර පොලිස් කාන්තා කාර්යාංශ සහ නෛතික ආරක්ෂණ නීති. - නමුත්, ඊට ප්‍රවේශය සීමා සහිතයි.
- කාන්තා අයිතිවාසිකම් පිළිබඳ කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන කීපයක්. – එනමුත්, ඔවුන්ගේ සේවාවන් නගරය පුරා විසිරී නැත.
- පොදු වැසිකිළි හා සේදුම් කාමර තිබේ. - එසේ වුවද, ඒවා බොහෝ දුරට අනාරක්ෂිත හා අපිරිසිදු වේ. පුරුෂ ආධිපත්‍යයට නතු වේ.

**අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?**

1. කාන්තාවන් සඳහා සනීපාරක්ෂක හා ආරක්ෂිත පොදු වැසිකිළි

- වෙළඳ සැල්, උද්‍යාන සහ ප්‍රවාහන මධ්‍යස්ථානවල පොදු වැසිකිළි පහසුකම් වැඩිදියුණු කිරීම:
  - සනීපාරක්ෂක බැහැර කිරීමේ බඳුන්
  - අගුල් සහ ආලෝකකරණය
  - නිතිපතා පිරිසිදු කිරීම සහ කාන්තා සේවිකාවන්

2. කාන්තා ආරක්ෂණ උපකාරක සේවය සහ Whatsapp වාර්තාකරණය

- කාන්තාවන් සඳහා හිරිහැර ඇතිවන හෝ අනාරක්ෂිත අවකාශයන් පිළිබඳව වාර්තා කිරීමට පැය 24/7 පුරා නගර මට්ටමේ උපකාරක  සේවාවක් සහ වට්ස්ඇප් දුරකථන අංකයක් හඳුන්වා දීම.

- අදාළ වාර්තා කිරීම්, ප්‍රාදේශීය කොට්ඨාසවල කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් සහ ළඟම ඇති පොලිස් ස්ථානය වෙත සම්බන්ධ කිරීම.

**අප හඳුන්වා දෙන නව අංග මොනවාද?**

1. ආරක්ෂිත වීදි සහ ප්‍රවාහනය

- ඉහළ අවදානම් සහිත ප්‍රදේශවල වැඩිමනත් වීදි ලාම්පු සහ සීසීටීවී කැමරා සවි කිරීම.
- නගර ආරක්ෂක හා පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩල කණ්ඩායම්හි කාන්තාවන්ගේ දෘෂ්‍යමානත්වය සහතික කිරීම.
- බස් රථ සහ බස් නැවතුම් අධීක්ෂණය කෙරෙන බවටත්, හිරිහැර කිරීම් සම්බන්ධයෙන් දැඩිව ක්‍රියා කරන බවටත් වග බලා ගැනීම සඳහා ප්‍රවාහන බලධාරීන් සමඟ කටයුතු කිරීම.
- සුහුරු රිටි නැවත හඳුන්වා දීම - සීසීටීවී කැමරා සහ ආලෝකකරණයෙන් සමන්විත නවීන සුහුරු රිටි, අධි අවදානම් සහිත කලාපවල සවි කිරීම.
  - මේවා හිරිහැර කිරීම වළක්වා ගැනීමට සහ රාත්‍රී කාල දෘෂ්‍යතාව වැඩි දියුණු කිරීමට උපකාරී වේ.
  - ඉක්මන් ප්‍රතිචාර දැක්වීම සඳහා කේන්ද්‍රගත අධීක්ෂණ පද්ධතියකට පිවිසුම් ලබා දේ.

2. නොමිලේ සනීපාරක්ෂක තුවා බැංකු

- පොදු වැසිකිළි, ප්‍රජා මධ්‍යස්ථාන සහ පාසල්වල " සනීපාරක්ෂක තුවා බැංකු" පිහිටුවීම.
- නිතිපතා ගබඩා කර පුහුණුව ලත් කාන්තා ස්වේච්ඡා සේවිකාවන් විසින් ඒවා පවත්වාගෙන යනු ලැබේ.

3. ගෞරවනීය කාඩ්පත්

- මහ නගරය විසින් නිකුත් කළ නොමිලේ හෝ වට්ටම් ලබා දෙන විශේෂ හැඳුනුම්පතක්:
  - පොදු වැසිකිළි.
  - ජංගම සායන.
  - කාන්තා කේන්ද්‍රී නිපුණතා වැඩසටහන්.
  - සනීපාරක්ෂක නිෂ්පාදන ඇසුරුම්.

4. සේවා ස්ථානයේ ආරක්ෂණ දැනුවත්භාවය

- ගෘහ සේවිකාවන්, වෙළෙන්දන්, සැලෝන් සේවකයන්, ඇඟලුම් සේවකයන් සහ ඔවුන්ගේ සේවායෝජකයින් සඳහා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නගරය පුරා වැඩමුළු පැවැත්වීම :
  - සේවා ස්ථාන අයිතිවාසිකම්.
  - අපයෝජනය හෝ හිරිහැර කිරීම යනු කුමක්ද?
  - උදව් ලබා ගත හැකි ස්ථාන.

5. ආත්මාරක්ෂාව සහ දැනුවත් කිරීමේ සැසි

- මූලික ආත්මාරක්ෂාව, අනතුර හඳුනා ගැනීම සහ ආරක්ෂාව සඳහා තාක්ෂණය භාවිතා කිරීම සම්බන්ධයෙන් ගැහැණු ළමයින් හා කාන්තාවන් සඳහා මාසිකව නොමිලේ පවත්වනු ලබන පුහුණු සැසි.

# පහසු වටපිටාවක දිවි ගෙවන්න, අභිමානයෙන් දිදුලන්න

## කොළඹ නගරය තුළ සංස්කෘතිය, නිර්මාණශීලිත්වය සහ ප්‍රජා ජීවිතය සැමරීමේ ප්‍රතිපත්තියක්

කොළඹ නගරයට තමන්ගේම වූ ප්‍රජා සවියක්, දක්ෂතාවක් හා පුරාවෘත්තයක් ඇත. එනමුත්, ඒවා සැමරීම සඳහා වූ අවකාශයන් ඊට නොමැත. 'පහසු වටපිටාවක දිවි ගෙවන්න, අභිමානයෙන් දිදුලන්න' යනුවෙන් වූ වැඩපිළිවෙළ මගින් ක්‍රීඩා ලීග, එළිමහන් උත්සව, තරුණ කලා කුසලතා හා වීදි ප්‍රසංග සමඟ ජන ජීවිතය නැවත නගරය වෙත ගෙන එයි. එමගින් කොළඹ නගරයේ නොසලකා අත්හැර දමන ලද අවකාශයන් පැහැබර සංස්කෘතික කලාප බවට පරිවර්තනය වනු ඇති අතර නගරය ප්‍රීතිමත්, නිපුණ හා අනන්‍ය නුවරක් ලෙස ස්ථානගත වනු ඇත.

**ගැටලුව**

- විශේෂයෙන් අඩු ආදායම්ලාභී ප්‍රදේශවල පිහිටි ඌණ උපයෝජිත ක්‍රීඩා පිටි හෝ තරුණ තරුණියන් සඳහා වූ පහසුකම්. දැනට පවතින ඒවා දුර්වල ලෙස නඩත්තු කර හෝ සීමා කිරීම්වලට යටත් කර හෝ ඇත.
- පවුල්, තරුණ තරුණියන් හෝ අමුත්තන් සඳහා විනෝදාස්වාද විකල්ප ඉතා ස්වල්පයකි. - විශේෂයෙන් සාප්පු සංකීර්ණවලින් පිටත ස්ථාන හෝ මිල අධික ස්ථාන පවතී.
- කොළඹ සංචාරකයින්ට හොඳින් ප්‍රදර්ශනය නොකෙරේ. උත්සව අවස්ථා, සංස්කෘතික ක්‍රියාකාරකම් හෝ දේශීය අත්දැකීම් අත්විඳීමට කේන්ද්‍රීයස්ථානයක් නොමැත.
- අපේ නගරය තුළ අක්‍රිය බවක් හා විසන්ධි වූ බවක් දැනෙන්නට තිබේ. – ප්‍රජාව තුළ ජ්වලිත බවක් නැත. නිරන්තර ක්‍රියාකාරකම් නැත. ප්‍රාදේශීය දක්ෂතාවලට හෝ නිර්මාණශීලීත්වයට ඇත්තේ අල්ප සහයෝගයකි.

**දැනට අප සතු දෑ කවරේ ද?**

- විශාල ක්‍රීඩාංගණ සහ පොදු උද්‍යාන කීපයක් ඇත. - බොහෝ දුරට එදිනෙදා ජනතාවගේ පරිහරණය සඳහා නොයෙදේ.
- ගාලු මුවදොර හා විහාරමහදේවි යන උද්‍යානවල හෝ පෞද්ගලික ස්ථානවල ඉඳහිට මුළුදෙන උත්සව.
- ජනප්‍රිය සංචාරක ස්ථාන - ගංගාරාම පන්සල, නිදහස් චතුරශ්‍රය හා පිටකොටුව - නමුත්, ඇත්තේ සීමිත කතන්දර කීම්, සීමිත ඇවිදීමේ මංතීරු සහ අල්ප මාර්ගෝපදේශිත අත්දැකීම් කීපයකි.
- දක්ෂ තරුණ තරුණියන්, කලාකරුවන් සහ නිර්මාණකරුවන් සිටී. - නමුත්, ඔවුනට පොදු වේදිකාවක් හෝ නගර අනුබලයක් නොමැත.

**අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?**

ක්‍රීඩා හා තරුණ සහභාගිත්වය

- අඩු භාවිතයක් සහිත පාසැල් හෝ රජය සතු ක්‍රීඩා පිටි සවස් කාලයේ දී / සති අන්තවල මහජන පරිහරණය සඳහා විවෘත කිරීම.
- කුඩා ක්‍රීඩා අවකාශ අලුත්වැඩියා කිරීම
- ප්‍රාදේශීය පුහුණුකරුවන් සහ ආම්පන්න සහාය සහිතව ක්‍රිකට්, පාපන්දු, නෙට්බෝල් සහ වොලිබෝල් යන ක්‍රීඩා ආශ්‍රිත කලාපීය තරුණ ලීග් තරගදියත් කිරීම.

විනෝදාස්වාද ප්‍රවේශය

- සතිපතා පැවැත්වෙන සංස්කෘතික උත්සව, නොමිලේ ප්‍රදර්ශනය කෙරෙන චිත්‍රපට රාත්‍රි හා සජීවී රංග ප්‍රසංග සඳහා නගරය සතු ස්ථාන සහ උද්‍යාන ප්‍රකෘතිමත් කිරීම.
- අඩු වියදම් අවසර පත්‍ර සහ තාක්ෂණික / සපයුම් සේවා සහාය සහිතව ප්‍රාදේශීය උත්සව සංවිධායකයින්ට සහ රංග ශිල්පීන්ට ආධාර කිරීම.
- පාසල් තූර්ය වාදක කණ්ඩායම්, වීදි රංග ශාලා, කතන්දර කීමේ සැසි යනාදී ප්‍රජා පාදක විනෝදාස්වාදය දිරිමත් කිරීම.

සංචාරක ප්‍රවර්ධනය

- කොළඹ නගරයේ උරුම පිහිටි ප්‍රදේශ ආලෝකමත් කිරීම.
- දේශීය පදිංචිකරුවන් (විශේෂයෙන් තරුණ හා වැඩිහිටි පිරිස්) සංචාරක මගපෙන්වන්නන්, කතන්දර කියන්නන්, ආහාර

පාගමන් හා සංස්කෘතික මංපෙත් යනාදියේ සත්කාරකයන් ලෙස පුහුණු කිරීම.

- සෘජුවම අමුත්තන්ට විකිණීමට තැබිය හැකි අයිතම සහිත දේශීය සිහිවටන වෙළඳපොලවල් කලාකරුවන්, නිෂ්පාදකයින් සහ කුඩා ව්‍යාපාරිකයන් සඳහා බිහි කිරීම.

නගර පුරා සති අන්ත උළෙල මාලාව

- "සති අන්ත කොළඹ" වැඩසටහන විවිධ ගෘහකාණ්ඩ ප්‍රදේශවල මරුවෙන් මාරුවට පැවැත්වීම:
- සංගීතය, වීදි ආහාර, නැටුම්, චිත්‍ර කලා බිත්ති, නයිට් බසාර්.
- සෑම ප්‍රදේශයකටම මෙම උත්සව පැවැත්වීම සඳහාත්, තම අභිමානය හා අනන්‍යතාව ඉන් විදහා දැක්වීමටත් සැමට අවස්ථාව සලසා දෙනු ඇත.

කුඩා ක්‍රීඩා පිටි සහ නාගරික ක්‍රීඩා අංගන

- හිස් ඉඩ අවකාශ, අත්හැර දැමූ පොදු අවකාශ සහ ගොඩනැගිලි පියෙසි මත ඇති හිස් අවකාශ පාපන්දු, පැසිපන්දු හා නෙට්බෝල් ක්‍රීඩා සඳහාවන ස්ථාන ලෙස පරිවර්තනය කිරීම.
- තරුණ තරුණියන් කාලය ගෙවා දමමින් රැඳී සිටින පහසුකම් රහිත ඉලක්කගත ප්‍රදේශ.

ජ්‍යෙෂ්ඨ පුරවැසි ව්‍යායාම් කලාප

- උද්‍යාන හා අසල්වැසි ගෘහකාණ්ඩ ප්‍රදේශවල වයස්ගත පදිංචිකරුවන් සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද ආරක්ෂිත හා එළිමහන්යෝග්‍යතා කලාප ඉදිකිරීම.
  - සරල උපකරණ, පැතලි මතුපිට, බංකු සහ සෙවන සහිත ප්‍රදේශ
  - කොළඹ වැඩිහිටියන් විෂයයෙහි සෞඛ්‍ය, සමාජ සම්බන්ධතා සහ අභිමානය ප්‍රවර්ධනය කෙරේ.

කොළඹ කේන්ද්‍ර අත්දැකීම

- ගාලු මුවදොර, පිටකොටුව සහ කොටුව යන ප්‍රදේශවල පහත දැක්වෙන කරුණු පෙරදැරිව කුඩා කුටි සකස් කිරීම:
- ප්‍රාදේශීක සිදුවීම් ප්‍රවර්ධනය කිරීම සඳහා;
- සංචාරකයින් හට ඇවිදීමේ චාරිකා සහ ත්‍රිරෝද රථ ගමන් වෙන්කරවා ගැනීමට සහය වීම සඳහා;
- සිතියම්, කතන්දර පොත් සහ ප්‍රදේශවාසීන්ගේ නිර්දේශ හුවමාරු කර ගැනීම සඳහා.

  - විචිත්‍රවත් යොවුන් උළෙල: සජීවී සංගීතය, ඩීජේ රාත්‍රි, ආහාර හා කලා උළෙල, එළිමහන් චිත්‍රපට තිරගත කිරීම්, රාත්‍රි වෙළෙඳුන් සහ බීච් බසාර්.

  - ඩිජිටල් බස්: සමාජ මාධ්‍ය අභියෝග, ටික්ටොක් කොලැබ්ස් සහ ඉන්ස්ටග්‍රෑම් කළ හැකි බිතුසිතුවම්, නියොන් සංඥා සහ දර්ශනීය ඡායාරූප ස්ථාන.

  - සුවතා සහ පරිසර නිංනාද: සූර්ය උදාවේ යෝගා ව්‍යායාම්, ශරීර යෝග්‍යතා සැසි, ශරීර සුවතා සැසි, වෙරළ පිරිසිදු කිරීම් සහ ස්වේච්ඡා වැඩසටහන්.

  - ජීවන රටාව හා සහකම්පනය: තේමාගත කෝපි හල් සහ නෙත්කළු සංඥා සලකුණු රටා සහ නිරන්තර වෙළඳ නාමකරණය.

# ආරක්ෂිත පියෙසි හා සවිමත් මූලාංකුර

## කොළඹ නගරය තුළ සුරක්ෂිත, ජීවත්වීමට සුදුසු සහ ගෞරවනීය නිවාස සඳහා ප්‍රතිපත්තියක්

කොළඹ නගරය තුළ බොහෝ පවුල් පිරිසිදු ජලය, සනීපාරක්ෂාව හෝ ව්‍යුහාත්මක ස්ථායිතාව සීමිතව ඇති අනාරක්ෂිත මහල් නිවාසවල හෝ අවදානම් ජනාවාසවල ජීවත් වෙති. ආරක්ෂිත පියෙසි හා සවිමත් මූලාංකුර ව්‍යාපෘතිය මගින් පවතින නිවාස වැඩිදියුණු කිරීම, අධි අවදානම් ප්‍රදේශ වල ජීවත්වන පුද්ගලයින් සාධාරණ අයුරින් යළි පදිංචි කිරීම සහ සුපැහැදිළි ප්‍රවේශය සහතික කරනු වස් ඩිජිටල් ලේඛනයක් ආරම්භ කිරීම මගින් මෙම ගැටලුව විසඳීමට කටයුතු කරයි. එය වූකලී නගරයේ සෑම නිවස්නකම ගෞරවය සහ ආරක්ෂාව යළි ස්ථාපිත කරීම සඳහා වන සැලැස්මකි.

**ප්‍රධාන පාර්ශවකරුවෝ**

- නාගරික සංවර්ධන අධිකාරිය
- කොළඹ මහ නගර සභාව
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- පුද්ගලික සංවර්ධකයින් සහ කොන්ත්‍රාත්කරුවන්
- සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

**නිවාසවල වත්මන් තත්ත්වය**

- කොළඹ ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් යටිතල පහසුකම් අවම මට්ටමක පවතින ජනාවාසවල ජීවත් වන අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට මූලික සනීපාරක්ෂක පහසුකම් හෝ සුරක්ෂිත නිවාස නොමැත.
- ඇතැම් පිරිස් සංවර්ධනය සඳහා නම් කර ඇති හෝ ජල ගැලීම්වලට යටවිය හැකි ප්‍රදේශවල ජීවත් වෙති.
- බොහෝ දෙනෙකුට නීත්‍යානුකූල අයිතියක් නොමැති වීම නිසා ඔවුන් ඉඩම්වලින් ඉවත් කිරීමේ අවධානමකට ලක්විය හැකිය.
- රජයේ මහල් නිවාස අධික ලෙස ජනාකීර්ණව පවතින අතර දුර්වල ලෙස නඩත්තු කර ඇත.
- නව නිවාස යෝජනා ක්‍රම බොහෝ විට පාසල්, රැකියා සහ සේවා ස්ථානවලින් දුරස්ථව ඉදිකර ඇත.

**දැනට අප සතු දෑ කවරේ ද?**

- අවිධිමත් ජනාවාසවල ජීවත්වන පවුල් ඉවත් කිරීම් හෝ ගංවතුර පිළිබඳ බියෙන් ජීවත් වෙති.
- ජලය, සනීපාරක්ෂාව සහ අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා දුර්වල ප්‍රවේශයක් පවතී.
- නඩත්තු කටයුතු සඳහා අරමුදල් නොමැතිව ගරා වැටුණු රාජ්‍ය නිවාස සංකීර්ණ පවතී
- නව නිවාස වෙන් කිරීම් සඳහා දිගු පොරොත්තු ලේඛන පැවතීම.
- නිවාස, ඉඩම් සහ උපයෝගිතා කළමනාකරණය කරන ආයතන අතර සම්බන්ධීකරණයේ දුර්වලතා පැවතීම
- නගරයේ යළි පදිංචි කිරීම කිරීම හෝ නිවාස වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක ප්‍රතිපත්තියක් නොමැත.

**අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?**

- අවිධිමත් ගෘහ සහ නිවාස තත්වයන් පිළිබඳ පොදු ලේඛනයක් සකස් කිරීම.
- හානියට පත් රජයේ මහල් නිවාස අදියර වශයෙන් අලුත්වැඩියා කිරීම ආරම්භ කිරීම.
- පවතින ජනාවාසවල ජලාපවහනය, අපද්‍රව්‍ය රැස් කිරීම සහ ජලය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම.
- දිගුකාලීන පදිංචිකරුවන්ට ඉඩම් අයිතිය හෝ වාසය කිරීමේ අයිතිය ලබා දීම.
- ජීවනෝපාය සහ පාසල් සඳහා ප්‍රවේශය සුරැකෙන පරිදි යළි පදිංචි කිරීම සම්බන්ධයෙන් පැහැදිලි මාර්ගෝපදේශ ලබා දීම.
- නිවාස පිළිබඳ සැලසුම් සහ තීරණවලට එළඹීමේදී ප්‍රජා සාමාජිකයින් සහ පදිංචිකරුවන් ඒ සඳහා සම්බන්ධ කර ගැනීම.

## අප හඳුන්වා දෙන නව අංග මොනවාද?

- සෑම පෙදෙසකම "ගෞරවසම්පන්න නිවාස කලාප" ආරම්භ කිරීම - නිසි වැසිකිළි, සෙවිලි සහ ආරක්ෂාව සහිත වැඩිදියුණු කිරීම් සිදු කිරීම.
- අඩු ආදායම්ලාභී පවුල් සඳහා ආරක්ෂිත ඒකක සහිත මිශ්‍ර ආදායම් නිවාස ඉදිකිරීම සඳහා පෞද්ගලික අංශය සමඟ සම්බන්ධවී කටයුතු කිරීම.
- සෑම නාගරික ප්‍රදේශයකම නිවාස පිළිබඳ පැමිණිලි භාරගැනීම සහ අයදුම්පත් නිකුත් කිරීම සඳහා සහාය වීම පිණිස නිවාස සහාය කවුළු ස්ථාපිත කිරීම.
- නිසි ආලෝකකරණය, ක්‍රීඩා පිටි සහ ආරක්ෂිත පදික වේදිකා සහිත ළමා ආරක්ෂිත සැලසුම් හඳුන්වා දීම.
- අඩු ආදායම්ලාභී ප්‍රදේශවල දැනට නොසලකා හරින ලද අවශ්‍යතාවයක් වන පවුල් සඳහා ගෞරවනීයව, දැරිය හැකි මිලකට අවමංගල්‍ය ශාලා සහ පිළිගැනීමේ ශාලා අවකාශ ලබා දීම සඳහා ප්‍රධාන අසල්වැසි ප්‍රදේශවල නාගරික අවමංගල්‍ය ශාලා සහ පිළිගැනීමේ ශාලා ඉදිකිරීම.

## ක්‍රමවේදය විනිවිද භාවයෙන් හා වගවීමෙන් යුක්ත කිරීම.

- සියලුම රජයේ නිවාස ව්‍යාපෘති සහ නඩත්තු තත්ත්වයන් පිළිබඳ පොදු දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.
- නිවාස වැඩිදියුණු කිරීම්, නව ඉදිකිරීම් සහ නොවිසඳී ඇති ගැටළු පිළිබඳ තොරතුරු මාසිකව යාවත්කාලීන කිරීම.
- නිවාස සැලසුම් සහ අයවැය සඳහා පුරවැසි ප්‍රවේශය.
- නගරාධිපති කාර්යාලය විසින් වාර්ෂික නිවාස වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.

# දිදුලන නගරය, අභිමානවත් නගරය

## කොළඹ නගරය ප්‍රායෝගිකව අලංකාර කිරීම සහ හරිත පොදු ස්ථාන සඳහා වන ප්‍රතිපත්තියක්

කොළඹ නගරය තම නිවස යැයි හඳුන්වන ජනතාව තරමටම එය විචිත්‍රවත් වීමට තරම් කොළඹ අගනුවරට හිමිකමක් හා අයිතියක් සතුව තිබේ. දිදුලන නගරය, අභිමානවත් නගරය නමින් වූ වැඩසටහන, නගරය පුරා පිහිටි සියලු කලාප තුළ ඇති නොසලකා හරින ලද අවකාශ පිරිසිදු කිරීම, මධ්‍යගතව පිහිටි ප්‍රදේශ හරිතකරණය කිරීම සහ ස්ථාවර ප්‍රමිතියක් යටතේ පවත්වා ගැනීම යන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කෙරෙන පරිසරයඅලංකරණය කිරීමේ ප්‍රායෝගික සැලැස්මකි. මෙය සුඛෝපභෝගීත්වය මුල් වූ වැඩපිළිවෙළක් නොවේ. හුදෙක් එය, අභිමානය හා පිරිසිදුකම පෙරදැරි කරගත් මාවතකින් මාවතකට, එක් බිත්තියකින් තවත් බිත්තියකට හා එක් ඉඩ අවකාශයකින් වෙනත් ඉඩ අවකාශයකට පිරියම් යොදමින් ජන අභිමානය ප්‍රතිස්ථාපනය කෙරෙන ක්‍රියාදාමයකි.

### දැනට අප සතු දෑ කවරේ ද?

- සමහර අලංකරණ ව්‍යාපෘති (උදා.: එෆ්.ආර්. සේනානායක මාවත, විහාරමහදේවි උද්‍යානය) බොහෝ දුරට මධ්‍යම කොළඹට සීමා වේ.
- වටරවුම්, ඇල දාර, හිස් පදික මංතීරු වැනි බොහෝ පොදු ස්ථාන දුර්වල ලෙස නඩත්තු කිරීම හේතුවෙන් ගරා වැටී කැලි කසලින් ගහනව තිබේ.
- පිරිසිදු කිරීම්, නඩත්තු කිරීම් සහ නෙත් පිනවන වැඩි දියුණු කිරීම් පිළිබඳව කටයුතු කරන දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණයක් නොමැත.
- ප්‍රජා පාදක අලංකරණ වැඩසටහන් හෝ පුරවැසි මැදිහත්වීම් තුළින් කෙරෙන මුලපිරීම් ඉතා අල්ප ය.
- අලංකාර කරන ලද අවකාශයන් සඳහා නිත්‍ය නඩත්තු සැලැස්මක් නොමැත. ඒවා බොහෝ විට අබලන් වේ.

### අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?

- ඇසට ප්‍රිය දසුනක් නොවන ප්‍රධාන ස්ථාන 25 ක් (බිත්ති, අහුමුළු, වටරවුම්, බස් නැවතුම්) හඳුනා ගෙන මාස 12 ක කාලයක් තුළ ඒවා පවිත්‍රත්වයට පත්කර හරිතකරණය කිරීමට ප්‍රමුඛතාව දීම.
- නාගරික කොට්ඨාස මට්ටමින් නඩත්තු දින දර්ශනයක් භාවිතා කරමින් පොදු තාප්ප හා ගැටිබැමි නිතිපතා අළුත්වැඩියා කර තීන්ත පිරියම් කිරීම.
- විශේෂයෙන් අධික වාහන තදබදය සහිත ප්‍රදේශවල දැකිය හැකි කැඩුණු පදික වේදිකා, තීන්ත පතුරුයාම්, අයාලේ වැඩුණු පඳුරු සහ කැඩුණු බංකු සවි කිරීම.
- හිස් ඉඩකඩ ප්‍රයෝජනවත්ව හා ආකර්ශනීය ලෙස තබා ගැනෙන පරිදි පිරිසිදු කිරීමේ කණ්ඩායම් සහ භූ දර්ශන කටයුතුවල නියැළී කම්කරුවන් සම්බන්ධීකරණය කිරීම.
- වාසස්ථාන, වෙළඳ සැල් සහ මහල් නිවාස ආසන්නයේ කුඩා අවකාශයන් පවත්වාගෙන යාම සඳහා කොට්ඨාස කාර්යාල සහ ප්‍රජා කණ්ඩායම් සම්බන්ධ කිරීම.

**අප හඳුන්වා දෙන නව අංග මොනවාද?**

- කුඩා අලංකරණ සඳහා අයවැය
  - ප්‍රජා දායකත්වය සහිතව නෙත්කළු පොදු අවකාශ වැඩි දියුණු කිරීම සඳහා කුඩා වාර්ෂික අරමුදලක් සෑම කොට්ඨාසයකටම ලැබේ.
- ගෘහකාණ්ඩ වටපිටාව තුළ තාප්ප හා බිත්ති ව්‍යාපෘති
  - හානියට පත් පොදු තාප්ප හා බිත්ති පිරිසිදු නිර්මාණාත්මක මෝස්තර සහිතව තරුණ හා ප්‍රාදේශීය කලාකරුවන් ලවා තීන්ත පිරියම් කර හෝ ටයිල් අල්ලා අළුත්වැඩියා කර ගනු ලැබේ.
- හරිත කොරිඩෝ සහ මුළු උද්‍යාන
  - අභාවිත මුළු හා බෙදුම් බිම්කඩ නියඟයට ඔරොත්තු දෙන පැල සිටුවීම මගින් අඩු නඩත්තුවක් සහිත ඉඩ අවකාශ බවට පත් කිරීම.
- පොදු බංකු සහ සෙවන සැලසීමේ වැඩසටහන
  - බස් නැවතුම් හා උද්‍යාන වැනි ඉහළ ජනරාශියක් සහිත ප්‍රදේශවල මූලික බංකු සහ සෙවන සඳන ආවරණ ස්ථාපනය කිරීම.
- ඍතුමය පිරිසිදු කිරීමේ වැඩසටහන්
  - සෑම වසරකම ප්‍රධාන පිරිසිදු කිරීමේ හා අලංකාර කිරීමේ දින දෙකක් සම්පූර්ණ මහජන සහභාගීත්වය ඇතිව නගරය පුරා සංවිධානය කිරීම.
- සංඥා පුවරු හා කණු අලංකරණය
  - සභාවේ සියලු සංඥා සලකුණු පිරිසිදු කර ප්‍රමිතිගත කිරීම, වීදි ලාම්පු කණු පාට කිරීම හා යල් පැන ගිය පෝස්ටර් ගලවා ඉවත් කිරීම.

**ක්‍රමවේදයේ විනිවිදභාවය හා වගවීම ඇති කිරීම**

- ඡායාරූපගත කිරීමට පෙර / පසු සියලුම අලංකරණ අයවැය සහ ව්‍යාපෘති, කොට්ඨාස අනුව මාර්ගගත ක්‍රමයට ලැයිස්තුගත කෙරේ.
- අලංකාර කළ වැඩ පරිශ්‍රවල තත්ත්වය පිළිබඳ කාර්තුමය යාවත්කාලීන කිරීමක් ලබා දෙන ලෙස සෑම කොට්ඨාශයකටම නියම කෙරේ.
- නොසලකා හරින ලද ස්ථානවල ඡායාරූප ජංගම ද්වාරයක් හරහා උඩුගත කර කඩිනම් ප්‍රතිචාර අපේක්ෂා කිරීමට පුරවැසියන්ට හැකි ය.
- නඩත්තු කිරීම සහ ප්‍රජා මැදිහත්වීම මත පදනම් වූ "මාසයේ කොට්ඨාසය" මාසිකව පිළිගැනීමට ලක් කිරීම.

**කඩිනම් අවධානාත්මක ක්ෂේත්‍ර**

- වෙළඳපළ කලාප : කුණු ඉවත් කිරීම, තාප්ප හා බිත්ති හුණු පිරියම් කිරීම, බංකු සවි කිරීම.
- ඇළ දාර : ජලමාර්ග පිරිසිදු කිරීම, අඩු නඩත්තු හරිත පරිශ්‍ර ස්ථාපනය කිරීම.
- කාර්යබහුල මංසන්ධි : වටරවුම්වල පැල රෝපණය, සංඥා හා සලකුණු පිරිසිදු කිරීම.
- පොදු වැසිකිළි අවට බාහිර බිම් හා සායන පිවිසුම් : අභිමානය සහ සනීපාරක්ෂාව සඳහා තීන්ත පිරියම් කිරීම, ටයිල් ඇල්ලීම හෝ හරිත පරිශ්‍රඑක් කිරීම.

# කොළඹ නගරයේ ව්‍යවසාය සවිබල ගැන්වුම

## තිරසාර වර්ධනයක් සඳහා සහයෝගිතා උපාය මාර්ගයක්

ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSME) කොළඹ ආර්ථිකයේ වැදගත් කොටසක් වන අතර, රැකියා, නවෝත්පාදන, සහ ප්‍රජා සංවර්ධනය සඳහා දායක වේ. සභාවේ අයවැය සීමා සැලකිල්ලට ගනිමින්, කොළඹ MSME සවිබල ගැන්වීමේ උපාය මාර්ගය, පෞද්ගලික අංශයට මුල්තැන දිය හැකි පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. එහිදී සභාව, රෙගුලාසි පිහිටුවීම, සහාය සැපයීම, සහ සහයෝගීතාව සහතික කිරීම මගින් පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියා කරයි. ප්‍රධාන අරමුණ වන්නේ වේගයෙන් විකාශනය වන ආර්ථිකයක් තුළ MSME වලට සාර්ථක වීමට සහ තරඟකාරී ලෙස පැවතීමට තිරසාර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීමයි.

**දැනට අප සතු දෑ කවරේ ද?**

- කොළඹ තුළ MSME 30,000කට වැඩි සංඛ්‍යාවක් සිටින අතර, මූල්‍ය ප්‍රවේශය සහ නවීන තාක්ෂණය සීමිතය.
- අකාර්යක්ෂම යටිතල පහසුකම් සහ නියාමන බාධක හේතුවෙන් ඉහළ මෙහෙයුම් වියදම්.
- නිෂ්පාදන, සිල්ලර, සහ සේවා ඇතුළු විවිධ අංශ හරහා සම්බන්ධිත සහාය ව්‍යුහයන්හි හිඟය.
- MSME හිමිකරුවන් සහ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් සහ වෘත්තීය සංවර්ධනය සඳහා සීමිත ප්‍රවේශය.
- MSME සහ විශාල ව්‍යාපාර හෝ පෞද්ගලික අංශයේ සංවිධාන අතර පුළුල් සහයෝගීතාවයක් නොමැති වීම.

**අප විසින් වැඩි දියුණු කළ යුත්තේ කුමක්ද?**

- පෞද්ගලික අංශය සමඟ හවුල්කාරිත්වයෙන් MSME මධ්‍යස්ථාන පිහිටුවීම පහසු කිරීම, අඩු වියදම් කාර්යාල ඉඩකඩ සහ හවුල් සම්පත් සැපයීම.
- බැංකු සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සමඟ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව හරහා මූල්‍යකරණය ලබා ගැනීමට සහාය වීම.
- MSME සඳහා නියාමන ක්‍රියාවලීන් සරල කිරීම, වඩා වේගවත් අනුමැතීන් සහතික කිරීම සහ නිලධාරිවාදී ප්‍රමාදයන් අඩු කිරීම.
- ව්‍යාපාරික දිස්ත්‍රික්ක සඳහා විශ්වසනීය විදුලි සැපයුම සහ අපද්‍රව්‍ය කළමනාකරණ සේවා වැනි යටිතල පහසුකම් සහාය සැපයීමට පෞද්ගලික අංශය විසින් මෙහෙයවන ආරම්භයන් දිරිගැන්වීම.
- තාක්ෂණික සමාගම්, ඩිජිටල් ආයතන, සහ ප්‍රාදේශීය විශ්වවිද්‍යාල සමඟ සහයෝගීතාවයන් හරහා MSME හිමිකරුවන්ට ඩිජිටල් මෙවලම් සහ පුහුණුව ලබා ගැනීමට හැකියාව ලබා දීම.

**අප හඳුන්වා දෙන නව අංග මොනවාද?**

- අපි රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව හරහා කොළඹ පුරා දැරිය හැකි හවුල් වැඩ අවකාශයන් නිර්මාණය කරමු, MSME සඳහා ව්‍යාපාරික සහාය සේවා සහ ජාල අවස්ථා සපයමින්.
- අපි MSME වලට ඊ-කොමර්ස් වෙබ් අඩවි සහ ගිණුම්කරණ මෘදුකාංග වැනි ඩිජිටල් මෙවලම් භාවිතා කිරීමට උපකාර කිරීම සඳහා තාක්ෂණ සමාගම් සමඟ හවුල් වනු ඇත, නගර සභාව විසින් මෙහෙයවන දිරිගැන්වීම් මගින් සහාය වනු ඇත.
- අපි ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍රවල දැරිය හැකි පාඨමාලා ඉදිරිපත් කිරීමට විශ්වවිද්‍යාල සහ පුහුණු සපයන්නන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර, නගර සභාව උත්සාහයන් සම්බන්ධීකරණය කිරීම සහ යටිතල පහසුකම් සැපයීම සිදු කරනු ඇත.

**ක්‍රමවේදයේ විනිවිදභාවය හා වගවීම ඇති කිරීම**

- අපි MSME කාර්ය සාධන වෙබ් අඩවියක් දියත් කරන්නෙමු, එහිදී ව්‍යාපාරවලට වැඩසටහන්, අරමුදල් විකල්ප, සහ සාර්ථක කතා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි වන අතර, පෞද්ගලික අංශ හවුල්කරුවන්ගේ දායකත්වය ද ඇතුළත් වේ.

- අපි MSME හිමිකරුවන්, පෞද්ගලික අංශයේ නියෝජිතයින්, සහ රජයේ නිලධාරීන්ගෙන් සමන්විත MSME උපදේශක කවුන්සිලයක් පිහිටුවන්නෙමු, ප්‍රතිපත්ති මඟ පෙන්වීම සහ අංශයේ අවශ්‍යතා විසඳීම සහතික කිරීම සඳහා.



# ක්‍රියාකාරී සැලැස්ම

## අදියර 1:

# පළමු මාස 6 තුළ – මහජන විශ්වාසය ගොඩනඟීම

## සුපැහැදිලි වෙනසක් ඇතිකිරීම, විශ්වාසය ගොඩනඟීම සහ ප්‍රතිසංස්කරණය සඳහා පදනම ස්ථාපිත කිරීම.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

- පිවිතුරු කොළඹ: 24/7 පිරිසිදු කිරීමේ කණ්ඩායම් පිහිටුවීම, පැමිණිලි සඳහා ක්ෂණික දුරකථන අංකය ක්‍රියාත්මක කිරීම, ට්‍රක් රථ ජීපීඑස්තාක්ෂණය ඔස්සේ නිරීක්ෂණය කිරීම
- ජලගැලීම්වලින් තොර කොළඹ නගරය: ප්‍රධාන ජලාපවහන මාර්ග පිරිසිදු කිරීම, ජලගැලීම් අවදානම් ප්‍රදේශ සිතියම්ගත කිරීම, ජලගැලීම් පිළිබඳ අනතුරු ඇඟවීම් ඇඟවීම් ප්‍රජා මට්ටමින් ක්‍රියාවට නැංවීම
- මනා ප්‍රෙවිශයක් සහිත කොළඹ නගරය: සම්බන්ධතා නොමැති ප්‍රදේශවල තුළ නියමු වෑන් රථ මාර්ග ආරම්භ කිරීම; පාසල් ප්‍රවේශය කෙරෙහි අවධානය යොමු කිරීම
- ගරුත්වය සුරැකි නිවාස: අන්තරායකර ගොඩනැගිලිවල හදිසි වැඩිදියුණු කිරීම් සිදුකිරීම, යළි පදිංචි කිරීම් සිදුකිරීම සඳහා කටයුතු සූදානම් කිරීම
- සුරක්ෂිත කාන්තාවන්: ඉහළ අවදානම් සහිත ස්ථාන 50ක් ආලෝකමත් කිරීම, සනීපාරක්ෂක තුවා බෙදා හැරීමේ මධ්‍යස්ථානය සහ කාන්තා උපකාරක මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම.
- කොළඹ රැකියා: රැකියා සම්බන්ධතා ප්‍රෙව්ශ විවෘත කිරීම, තරුණ ලියාපදිංචිය සහ කුසලතා සැසි ආරම්භ කිරීම.
- කොළඹදී ක්‍රීඩාවේ යෙදෙමු: මාසිකව ජනාශ්‍රිත උත්සව පැවැත්වීම සහ ප්‍රජා ක්‍රීඩා අවකාශ විවෘත කිරීම
- ඩිජිටල් කවුන්සිලය: වෙළඳ බලපත්‍ර / වෙළඳ කුටි බලපත්‍ර ඩිජිටල්කරණය කිරීම, පැමිණිලි ද්වාරය සහ වියදම් නිරීක්ෂණ පද්ධතිය ඇරඹීමට කටයුතු කිරීම
- මුල් අවධියේ සිට එක හා සමානව ඉගෙන ගැනීම: ජංගම පාසල් පෙර පාසල් පද්ධති දෙකක් මූලිකව ආරම්භ කිරීම, පාසලෙන් පසු උපකාරක මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- සැමට කොළඹ: ප්‍රවේශ්‍යතා පිළිබඳ තක්සේරු කිරීම ආරම්භ කිරීම සහ ප්‍රධාන ස්ථාන 10ක බෑවුම් මං ඉදිකිරීම

**සාර්ථකත්වය කෙබඳුවේද?**

- පිරිසිදු වීථි, ආරක්ෂිත ප්‍රදේශ, පළමු ඩිජිටල් මෙවලම් ක්‍රියාත්මක වීම.
- දරුවන්, වැඩිහිටියන් සහ කාන්තාවන් තුළ තමන් පිළිගැනීමට ලක්වන බව සහ තමාට සහාය ලැබෙන බව දැනීම.
- පුද්ගලයින්ට දැකීමට හැකි, දැනෙන හා භාවිතයට යොදාගත හැකි දෘෂ්‍යමාන වෙනස

## අදියර 2:
## මාස 6 සිට 18 දක්වා – පද්ධති ගොඩනැගීම සහ පරිමාණය පුළුල් කිරීම

ප්‍රතිසංස්කරණ තර කිරීම, සේවා පුළුල් කිරීම සහ කල් පවතින පද්ධති ස්ථාපිත කිරීම.

**ප්‍රධාන ක්‍රියාමාර්ග**

- පිවිතුරු කොළඹ: පරිමාණ වර්ගීකරණය සහ කසල ගොඩගැසීම වැළැක්වීමේ ක්‍රියාමාර්ග බලාත්මක කිරීම
- ජලගැලීම්වලින් තොර කොළඹ නගරය: ප්‍රධාන ජලාපවහන මාර්ගවල සංවේදක ස්ථාපනය කිරීම, අවදානම් සහිත ක්ෂුද්‍ර ජලාපවහනය වැඩි දියුණු කිරීම
- ප්‍රවාහනය: ප්‍රජා වෑන් ජාලය කලාප 5+ දක්වා පුළුල් කිරීම, බස් නැවතුම් ස්ථාන ආරක්ෂණ නිරීක්ෂණ ඩිජිටල්කරණය කිරීම
- නිවාස: මහල් නිවාසවල ස්ථානීය වැඩිදියුණු කිරීම් ආරම්භ නිරීම, ඩිජිටල් නිවාස ලේඛනය ආරම්භ කිරීම
- කාන්තාවන්: කාන්තාවන්ට පමණක් වූ මධ්‍යස්ථාන 3ක් ස්ථාපිත කිරීම, ස්ථාන 15ක සනීපාරක්ෂක තුවා බෙදා හැරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම
- රැකියා: තරුණ රැකියා කේන්ද්‍ර ආරම්භ කිරීම, තරුණ ව්‍යවසායකයින් සඳහා ක්ෂුද්‍ර ණය ප්‍රදාන වැඩසටහන ආරම්භ කිරීම
- විනෝදාස්වාදය: සංස්කෘතික උත්සව වැඩසටහන් 6ක් දක්වා පුළුල් කිරීම, කොළඹ සංස්කෘතික කාඩ් පත ඇරඹීම
- ඩිජිටල් කවුන්සිලය: ගාස්තු ගෙවීම සඳහා භෞතික මුදල් රහිත ක්‍රම භාවිතයට ගැනීම, නගරයේ සියලු ව්‍යාපෘතිවලට QR කේත එකතු කිරීම
- අධ්‍යාපනය: ජංගම පෙර පාසල් පුළුල් කිරීම, නගර ළමා අවසර පත්‍රය හඳුන්වා දීම, ළමාරක්ෂක සේවකයින් පුහුණු කිරීම
- සම්බන්ධීකරණය: කොළඹ රැකවරණ අවසර පත්‍රය ක්‍රියාත්මක කිරීම, සංඥා සහ සන්නිවේදන යාවත්කාලීන කිරීම් ආරම්භ කිරීම, ප්‍රවේශ මාර්ගෝපදේශකරුවන් පුහුණු කිරීම
- ඩිමෙන්ශියා රෝගීන් රැකබලා ගන්නන් මත වන බර ලිහිල් කිරීම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා එම රෝගයෙන් පෙළෙන පුද්ගලයින් සඳහා ප්‍රජා පාදක දින සහාය කණ්ඩායම් ස්ථාපිත සහ Safe Return හැඳුනුම්පත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම .
- අඩු පහසුකම් සහිත ප්‍රජාවන්ට ප්‍රවේශ විය හැකි පර්දි වැඩි වැඩියෙන් ජංගම සායන සහ අසල්වැසි සෞඛ්‍ය සායන පැවැත්වීම.

**සාර්ථකත්වය කෙබඳුවේද?**

- වර්තමානයේ බොහෝ නගර සේවා මාර්ගගතව ලබා ගත හැකිය
- තරුණයින් රැකියා කරමින් හෝ පුහුණුව ලබමින් සිටිති; පවුල් වැඩිදියුණු වූ නිවාසවල ජීවත්වනු පෙනේ
- පොදු ස්ථාන ක්‍රියාකාරී වේ, වැඩසටහන් සිදුවෙමින් පවතී, කොළඹ ජීවමාන බවක් දැනේ

## 3 වන අදියර:
## මාස 18 සිට අවුරුදු 3 දක්වා – උරුමය සහ දිගු කාලීන බලපෑම

ප්‍රතිසංස්කරණ, අනාගතය සනාථ කිරීම සහ නාගරික ජීවිතය පරිවර්තනය කිරීම.

**ප්‍රධාන ක්‍රියාමාර්ග**


- සභා බලපත්‍ර, ගෙවීම් සහ පැමිණිලි සියල්ල 100%ක් ඩිජිටල්කරණය කිරීම.
- සියලු ප්‍රධාන ජලාපවහන පද්ධති සහ ජල ගැලුම් ප්‍රදේශ, සුහුරු තාක්‍ෂණය ඔස්සේ නිරීක්ෂණය කර කළමනාකරණය කිරීම.
- පෞද්ගලික හවුල්කාරිත්වයන් හරහා තරුණ රැකියා පද්ධතිය පවත්වා ගෙනයාම.
- අඩු පහසුකම් සහිත සෑම ප්‍රදේශයකම ළමා හිතකාමී කලාප ස්ථාපිත කිරීම
- සියලුම ප්‍රධාන පොදු ස්ථානවල වැඩිහිටියන් සහ ආබාධිත අය සඳහා ප්‍රවේශය තහවුරු කිරීම
- සංස්කෘතිය, ක්‍රීඩා සහ සංචාරක ක්‍රියාකාරකම් කොළඹ එදිනෙදා ජීවිතයේ අංගයක් බවට පත් කිරීම
- සෑම ව්‍යාපෘතියක් වෙනුවෙන් වැය කරන සෑම රුපියලක්ම විනිවිදභාවයකින් යුතුව වාර්තා කිරීම

**සාර්ථකත්වය කෙබඳුවේද?**

- කොළඹ නගරය ඩිජිටල්, අංගසම්පූර්ණ සහ ජනතා මූලික නගරයක් සඳහා ආදර්ශයක් බවට පත්වේ
- සේවා වඩා හොඳින් ක්‍රියාත්මක වේ, නාස්තිය කළමනාකරණය කෙරේ, දූෂණය පිටු දකියි
- තරුණයින්, කාන්තාවන්, වැඩිහිටියන් සහ ළමයින් යන සියල්ලන්ටම නගරය තමන්ටම අයිති බව හැගේ.

# සතුටින් සපිරි කොළඹ නගරය
# කාර්ය සාධක ආකෘතිය

සතුටින් පිරි කොළඹ පුරවරයකට



## අවධානය යොමු කරන සෑම ප්‍රදේශයක්ම සේවා සැපයීම, විනිවිදභාවය සහ නීතිමය වගවීම සහතික කිරීම උදෙසා කැපවීමෙන් ක්‍රියාකරන කාර්ය සාධක බලකායක් විසින් මෙහෙයවනු ලැබේ.

**සියලුම කාර්ය සාධක බලකායන් සඳහා ප්‍රධාන මූලධර්ම:**

- නගරාධිපති හෝ නියෝජ්‍ය සභාපතිවරයා විසින් මෙහෙයවනු ලැබේ
- විෂය පිළිබඳ විශේෂඥයින්, සියලුම දේශපාලන පක්ෂවල මන්ත්‍රීවරුන් සහ ප්‍රජා නියෝජිතයින් ඇතුළත් වේ.
- නීති, රෙගුලාසි සහ බලාත්මක කිරීම පිළිබඳ මග පෙන්වීම සඳහා කැපවූ නීති උපදේශකයෙකු හෝ උපදේශක මණ්ඩලයක් විසින් සහාය දක්වනු ලැබේ.
- ප්‍රගතිය සමාලෝචනය කිරීම, ගැටළු විසඳීම සහ යාවත්කාලීන තොරතුරු ප්‍රකාශයට පත් කිරීම සඳහා මාසිකව රැස්වේ.
- කොළඹ ප්‍රධාන දැන්වීම් පුවරුව සහ ප්‍රාදේශීය මට්ටමේ දැන්වීම් පුවරු හරහා ප්‍රගතිය සන්නිවේදනය කෙරේ.

**සුපැහැදිලි වීදි ජාලය සහ පවිත්‍ර පද්ධති - කාර්ය සාධක බලකාය**

අවධානය: අපද්‍රව්‍ය එකතු කිරීම, ප්‍රතිචක්‍රීකරණය, බඳුන් කළමනාකරණය

සාමාජිකයින්:

- ජ්‍යෙෂ්ඨ අපද්‍රව්‍ය කළමනාකරණ විශේෂඥ
- මහජන සෞඛ්‍ය පරීක්ෂක
- කොළඹ මහ නගර සභාවේ සනීපාරක්ෂක ඉංජිනේරු
- කලාප නියෝජනය කරන මන්ත්‍රීවරුන්
- පෞද්ගලික අපද්‍රව්‍ය/ප්‍රතිචක්‍රීකරණ සමාගම් නියෝජිත
- පිරිසිදු කිරීමේ වැඩසටහනේ ප්‍රජා නායක
- පාරිසරික සහ නාගරික නීතිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා නීති උපදේශක

### අද වියළි හෙට ආරක්ෂිත - කාර්ය සාධක බලකාය

අවධානය: ජලාපවහනය, ජල ගැලීම්, අපජල පද්ධති, ක්ෂුද්‍ර ජලාපවහන පද්ධති වැඩිදියුණු කිරීම්

සාමාජිකයින්:

- සිවිල් ඉංජිනේරු (ජලාපවහනය/ජල ගැලීම්)
- කොළඹ මහ නගර සභාවේ ජලාපවහන කණ්ඩායම් නායක
- පාරිසරික රාජ්‍ය නොවන සංවිධාන නියෝජිත
- අධි අවදානම් කලාප තරුණ නියෝජිත
- ජල ගැලීම්වලට ගොදුරු විය කලාපයේ මන්ත්‍රී
- පොදු වැඩ නියෝජිත
- ඉඩම් භාවිතය, පාරිසරික ආරක්ෂාව සහ කොන්ත්‍රාත්කරුවන් සඳහා වන මාර්ගෝපදේශ පිළිබඳ නීති උපදේශක

### අද වියළි හෙට ආරක්ෂිත - කාර්ය සාධක බලකාය

අවධානය: ජලාපවහනය, ජල ගැලීම්, අපජල පද්ධති, ක්ෂුද්‍ර ජලාපවහන පද්ධති වැඩිදියුණු කිරීම්

සාමාජිකයින්:

- සිවිල් ඉංජිනේරු (ජලාපවාහන/ජල ගැලීම්)
- කොළඹ මහ නගර සභාවේ ජලාපවහන කණ්ඩායම් නායක
- රාජ්‍ය නොවන පාරිසරික සංවිධාන නියෝජිත
- අධි අවදානම් කලාප තරුණ නියෝජිත
- ජලගැලීම් වලට ගොදුරු විය කලාපයේ මන්ත්‍රී
- පොදු වැඩ නියෝජිත
- ඉඩම් භාවිතය, පාරිසරික ආරක්ෂාව සහ කොන්ත්‍රාත්කරුවන් සඳහා වන මාර්ගෝපදේශ පිළිබඳ නීති උපදේශක

**ආරක්ෂිත පියෙසි හා සවිමත් මූලාංකුර - කාර්ය සාධක බලකාය**

අවධානය: අඩු ආදායම්ලාභී නිවාස වැඩිදියුණු කිරීම්, යළි පදිංචි කිරීම, නීතිමය අයිතිවාසිකම්

සාමාජිකයින්:

- නාගරික සැලසුම්/නිවාස පිළිබඳ විශේෂඥ
- නිවාස අමාත්‍යාංශ නියෝජිත
- මහල් නිවාසයක ප්‍රජා නායක
- කාන්තා ගෘහ මූලික නියෝජිත
- ඉඩම් අයිතිවාසිකම් රාජ්‍ය නොවන සංවිධානය
- නිවාස කේන්ද්‍ර කරගත් කලාපවල මන්ත්‍රීවරු
- කුලී නිවැසියන්, ඉඩම් අයිතිය සහ යළි පදිංචි කිරීමේ නීතිය පිළිබඳ නීති උපදේශක

**නගරයේ වෙසෙන කාන්තාවගේ අයිතිය - කාර්ය සාධක බලකාය**

අවධානය: කාන්තා ආරක්ෂාව, සනීපාරක්ෂාව, පොදු ස්ථානවලට ප්‍රවේශය

සාමාජිකයින්:

- කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිනිය
- විවිධ පක්ෂවලින් පැමිණි කාන්තා මන්ත්‍රීවරියන්
- වෙළඳපොළ නියෝජිත හෝ අවිධිමත් සේවක නියෝජිත
- පොලිස් නියෝජිත හෝ මහජන ආරක්ෂක නිලධාරි
- කාන්තා නායකත්වයෙන් යුත් සංවිධානයක තරුණ නියෝජිත
- සමාජ සේවිකාව (ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට අදාළ)
- වදහිංසා නීති, ස්ත්‍රී පුරුෂ භාවය ආරක්ෂා කිරීම සහ බලාත්මක කිරීම හා සම්බන්ධ නීති උපදේශක

**අනාගතය ගොඩනගන රැකියා - කාර්ය සාධක බලකාය**

අවධානය: තරුණ රැකියා, කුසලතා සංවර්ධනය, ව්‍යවසායකත්වය

සාමාජිකයින්:

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හෝ ආරම්භක නායකයෙක්
- වෘත්තීය පුහුණුකරුවෙක්
- තරුණ හෝ ආර්ථිකය පිළිබඳ අවධානයක් යොමු කරන උපදේශකයෙක්
- සේවා නියුක්ත කළ හැකි තරුණයින් දෙදෙනෙක්
- ව්‍යාපාර මණ්ඩල නියෝජිතයෙක්
- තරුණ රැකියා සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන
- කම්කරු නීතිය, කොන්ත්‍රාත්තු සහ ක්ෂුද්‍ර ව්‍යවසාය අනුකූලතාව පිළිබඳ නීති උපදේශක

**පහසු වටපිටාවක දිවි ගෙවන්න, අභිමානයෙන් දිදුලන්න - කාර්ය සාධක බලකාය**

අවධානය: ක්‍රීඩා, විනෝදාස්වාදය, පොදු උත්සව, සංචාරක ව්‍යාපාරය

සාමාජිකයින්:

- ක්‍රීඩා පුහුණුකරු හෝ තරුණ කණ්ඩායම් කළමනාකරු
- සංස්කෘතික උත්සව සැලසුම්කරු හෝ කලාකරු
- ක්‍රියාකාරී කලාපවල මන්ත්‍රීවරු
- සංචාරක මණ්ඩල නියෝජිත
- මහජන ආරක්ෂාව/සැපයුම් නිලධාරී
- කලා/රංගන ප්‍රජාවේ තරුණ නියෝජිත
- පොදු උත්සව රෙගුලාසි, කලාකරු බලපත්‍ර සහ වෙළඳ බලපත්‍ර පිළිබඳ නීති උපදේශක

**සුහුරු නගරයක්, පවිත්‍ර පද්ධතියක් - කාර්ය සාධක බලකාය**

අවධානය: තාක්ෂණය, ඩිජිටල්කරණය, විනිවිදභාවය, දූෂණ විරෝධීත්වය

සාමාජිකයින්:

- තාක්ෂණික ක්‍රියාත්මක කිරීමේ විශේෂඥ
- සයිබර් ආරක්ෂණ උපදේශක
- ඩිජිටල් තරුණ ආරම්භක නියෝජිත
- කො.න.ස. අභ්‍යන්තර විගණක
- සියලුම පක්ෂවල මන්ත්‍රීවරුන්
- විවෘත පාලනය කෙරෙහි අවධානය යොමු කළ රාජ්‍ය නොවන සංවිධාන
- දත්ත පෞද්ගලිකත්වය, ඩිජිටල් අයිතිවාසිකම් සහ විද්‍යුත් පාලන නීතිය පිළිබඳ නීති උපදේශක

**මුල් අවධියේ සිට එක හා සමානව ඉගෙන ගැනීම - කාර්ය සාධක බලකාය**

අවධානය: මුල් ළමාවිය ප්‍රවේශය, ඉගෙනුම් මධ්‍යස්ථාන, දෙමාපිය සහාය

සාමාජිකයින්:

- පෙර පාසල් ගුරුවරියක් හෝ මුල් ළමාවිය විශේෂඥවරියක්
- අඩු පහසුකම් සහිත කලාපයක දෙමාපිය නියෝජිතයෙක්
- තරුණ ස්වේච්ඡා උපදේශකවරියක්
- පාසල් ප්‍රවේශය කෙරෙහි අවධානය යොමු කළ රාජ්‍ය නොවන සංවිධාන
- ප්‍රජා කාන්තා කණ්ඩායම් නියෝජිත
- අධ්‍යාපන අමාත්‍යාංශ නියෝජිත
- ළමා ආරක්ෂාව, අධ්‍යාපන අයිතිවාසිකම් සහ ආරක්ෂිත ස්ථාන පිළිබඳ නීති උපදේශක

## සෑම පියවරක් සඳහාම ප්‍රවේශය සලසා ගැනීම - කාර්ය සාධක බලකාය

අවධානය: වැඩිහිටියන් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශ්‍යතාව, සම්බන්ධකර ගැනීම, සංචලතාව

සාමාජිකයින්:

- ආබාධිත අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින නිළධාරී
- නාගරික ගෘහ නිර්මාණ ශිල්පී (ඇතුළත් නිර්මාණය)
- මිශ්‍ර භාවිත කලාපයක මන්ත්‍රීවරයෙක්
- ජ්‍යෙෂ්ඨ පුරවැසි නියෝජිතයෙක්
- රැකබලා ගන්නෙකු හෝ සහාය සේවක නියෝජිතයෙක්
- ආබාධිත සේවා සඳහා සේවය කරන රාජ්‍ය නොවන සංවිධාන
- ප්‍රවේශ අයිතිවාසිකම්, ගොඩනැගිලි කේත අනුකූලතාවය සහ වෙනස්කොට සැලකීම් විරෝධී නීතිය පිළිබඳ නීති උපදේශක

ස්තූතියි

වෛද්‍ය රුවයිස් හනීෆා

drruvaizhaniffa.lk

